සුබො බුද්ධානං උප්පාදො!

බුදුරජාණන්වහන්සේලාගේ පහළවීම සැමට සුවදායකය...

# මජ්ඣෙ සූත්‍රය

(අන්තද්වය විශිෂ්ටඥානයෙන් දැන 'ප්‍රඥායෙන් මධ්‍යයෙහි නොඇලීම')

'ඇති බවක්' වැඩෙන විට 'භව' හැදෙන 'අන්ත යනු'
'ප්‍රත්‍ය වීම ම නිරෝධය වන හේතු-ඵල' බව දුටුවහොත්
මැදක් එහි හසු නොවී 'නිරායාසව' මිදෙන... ඒ සිහි-නැණට
ආශ්චර්ය අද්භූත පාරිශුද්ධ - 'අනන්ත' නිර්වානය ම හමුවන්නේය....
සම්බුද්ධ ප්‍රභාවට පමණක් ම දිස්වූ, අද ද සුදීප්තව දිදුලන
ඒ 'ලෝක-උත්තර මග' යළිත් 'නිර්-මලව' විවර කරදෙන්නට ය...

පූජනීය

ගලතර ධම්මරක්ඛිතතිස්ස ස්වාමීන්වහන්සේ

*සුඛං වා යදි වා දුක්ඛං - අදුක්ඛමසුඛං සහ*
*අජ්ඣත්තඤ්ච බහිද්ධා ච - යං කිඤ්චි අත්ථි වෙදිතං.*
*එතං දුක්ඛන්ති ඤත්වාන - මොසධම්මං පලොකිතං*
*ඵුස්ස ඵුස්ස වයං පස්සං - එවං තත්ථ විජානාති*
*වෙදනානං ඛයා භික්ඛු - නිච්ඡාතො පරිනිබ්බුතො' ති...*

සුඛ, දුක්ඛ හෝ අදුක්ඛමසුඛ වූ, ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි යම්ම කිසි වේදයිතයක් ඇත්නම්, ඒ සියල්ලම දුක යැයි ද, නැසෙන වැනසෙන බිඳීයන සුලු, 'රැවටෙන සුලු' දෙයකැයි ද **'නුවණින්' තේරුම් ගත්විට, ස්පර්ශයක් ස්පර්ශයක් පාසා සිදුවන නිරෝධ ධර්මතාවය *'විදර්ශනා නුවණින්'* දක්නේය.** වේදනාවන් ක්ෂය වූ ඒ භික්ෂුව තෘෂ්ණා රහිත වූවාහු පිරිනිවුණේ වෙයි.

*අනත්තනි අත්තමානිං - පස්ස ලොකං සදෙවකං,*
*නිවිට්ඨං නාමරූපස්මිං - ඉදං සච්චන්ති මඤ්ඤති.*
*යෙන යෙන හි මඤ්ඤන්ති - තතො තං හොති අඤ්ඤථා*
*තං හි තස්ස මුසා හොති - මොසධම්මං හි ඉත්තරං.*
*අමොසධම්මං නිබ්බානං - තදරියා සච්චතො විදූ*
*තෙ වෙ සච්චාභිසමයා - නිච්ඡාතා පරිනිබ්බුතා ති...*

'අනාත්ම වූ දෙයක ආත්මයක් දක්නා' දෙවියන් සහිත ලෝකයා දෙස බලව. 'නාමරූපය' තුළ වසමින්, **'මෙය සත්‍යයක් ම'** යැයි මමත්වයෙන් හඟී. එසේ 'සත්‍යයක් ම වූ යම් යම් දෙයක්' බවට මඤ්ඤනා කළත්, ඒ 'ආත්ම බවට මඤ්ඤනා කරන දෙය' අන්‍යාකාරයකට පත්වෙයි. එබැවින්, **'ආත්ම ලෙස හැඟීම ම' එහි ඇති බොරුව හා රැවටීමයි.**

මුලා නොවෙන, **නොරැවටෙන ස්වභාව ඇති නිවන ම සත්‍යය බව ආර්යයන් වහන්සේලා දත්හ.** ***'සත්‍යාවබෝධයෙන්'*** ඒ උතුමෝ ***'තෘෂ්ණාව රහිත වූවාහු පිරිනිවියාහු'* වෙති.**

- ද්වයතානුපස්සනා සූත්‍රය, සුත්තනිපාතය, ඛුද්දක නිකාය -

***නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!***

***සො උභන්තෙ විදිත්වාන - මජ්ඣෙ මන්තා න ලිප්පති***
***තං බ්‍රෑමි මහාපුරිසොති - සො'ධ සිබ්බනිමච්චගා...***

ශ්‍රද්ධාවන්ත කාරුණික පින්වතුනි, තුන්ලෝකාග්‍ර බුදුපියාණන් වහන්සේගේ උතුම් ධර්මය ශ්‍රවණය කරන්නට තරම් ඔබත් අපිත් ඉතාමත්ම වාසනාවන්ත බවට පත්වුණා. පින්වතුනි, කර්මඵල විස්වාස කරන සම්බුදු දහම ශ්‍රවණය කරන්නට ඒ කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගන්නට, ඒ වගේම ඒ දහම ශ්‍රද්ධාවෙන් පිළිගන්නට තරම් අපි වාසනාවන්ත වුණේ බොහෝ පුණ්‍යකර්ම වල ඵලයක් ලෙසට වෙන්නට පුළුවන්. 'කර්මඵල විස්වාසය නැති' වෙනත් මිථ්‍යා දර්ශන වලට හසුවුණ කෙනෙකුට පින්වතුනි සංසාරික ජීවිතය බොහෝ දුක් වලට භාජනය වන්නට සිද්ධ වෙනවා. හේතුව, ඒ දර්ශනවල උගන්වන ඒ මත වලට අනුව කුසල් අකුසල් නොපිළිගන්නවා නම්, ඒ වගේම පාපය සමා කළ හැකි බව පිළිගන්නවා නම්, ඒ නිසා බොහෝ අකුසල් කරන්නට යමෙකු පෙළඹෙනවා. පින්වතුනි, බෞද්ධ අපි ඒ බුද්ධ දේශනාවට අනුව පින් පව්, කුසල් අකුසල් පිළිගන්න නිසා අපි බොහෝ අකුසල් වලින් වැළකී, කුසල ධර්ම වලට යොමුවෙනවා.

ඉතින් ඒ නිසා ඒ වටිනා උතුම් උරුමය, අපි ලබා ගත්ත මේ මනුස්ස ජීවිතය, තථාගත බුදුරජාණන්වහන්සේගේ උතුම් නිර්මල ධර්මයට අනුව සකස්කර ගත්තොත් එහි වටිනාකම කියා නිම කරන්නට බැහැ.

අද ධර්මදේශනාවට මාතෘකා වශයෙන් අපි තබා ගත්තේ **අඞ්ගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ දුතිය පණ්ණාසකයේ මහා වග්ගයට අයිති මජ්ඣෙ සූත්‍රය.** මේ සූත්‍රයේ නිදානය වශයෙන් පෙන්නන්නේ භාග්‍යවතුන්වහන්සේ බරණැස ඉසිපතනයේ මිගදායේ වැඩවසන කාලයේ මණ්ඩල මාලයට රැස් වූ ස්ථවිර භික්ෂූන් වහන්සේලා අතර ඇතිවූ ධර්ම සාකච්ඡාවක් පිළිබඳවයි.

එහිදී මේ භික්ෂූන් වහන්සේලා අතර මෙවන් ධර්ම සාකච්ඡාවක් ඇතිවුණා. තථාගතයන් වහන්සේ තිස්සමෙත්තෙයිය කියන ප්‍රශ්නයේදී ඒ තිස්සමෙත්තෙයිය මානවක හට දේශනා කළ ඉහතින් සඳහන් කළ ගාථා ධර්මයේ තේරුම අනුව, මේ භික්ෂූන්වහන්සේලාට එයින් පෙන්නන අර්ථය පිළිබඳ යම් දැකීම් සමූහයක් ඇතිවුණා. ඉතින් ඒ දැකීම් සමූහයට අනුව උන්වහන්සේලා තම තමන්ගේ අදහස් ප්‍රකාශ කරනවා.

***සො උභන්තෙ විදිත්වාන - මජ්ඣෙ මන්තා න ලිප්පති***
***තං බ්‍රෑමි මහාපුරිසොති - සො'ධ සිබ්බනිමච්චගා...***

එහි අර්ථය වශයෙන් පෙන්නන්නේ 'යම් කෙනෙක් **උභයාර්ථය නුවණින් අවබෝධ කරගෙන, මැද ප්‍රඥාවෙන් නොඇලේද, ඔහුට 'මහාපුරුෂයා' යැයි කියමි. හෙතෙමේ සිබ්බනිය නම් මැහුම්කාරිය ඉක්මවා ගියේ වෙයි'** කියලයි.

ඉතින් ඒ ගාථාවේ අදහස් වලට අනුව එක භික්ෂූන්වහන්සේනමක් අහනවා - *කතමො නු ඛො ආවුසො එකො අන්තො, කතමො දුතියො අන්තො, කිං මජ්ඣෙ, කා සිබ්බනීති....* ඇවැත්නි, එහි දැක්වෙන **පළමුවෙනි අන්තය** කුමක්ද, **දෙවෙනි අන්තය** කුමක්ද, මැද කුමක්ද, **සිබ්බනිය** යනු කුමක්ද?

- වෙනත් භික්ෂූන්වහන්සේනමක් ඒ අවස්ථාවෙ ප්‍රකාශ කරනවා, *ඵස්සො ඛො ආවුසො එකො අන්තො, ඵස්සසමුදයො දුතියො අන්තො, ඵස්ස නිරොධො මජ්ඣෙ, තණ්හා සිබ්බනී...*
  ඇවැත්නි, එක අන්තයක් තමයි ස්පර්ශය, අනිත් අන්තය තමයි ස්පර්ශ සමුදය, ස්පර්ශ නිරෝධය මැදයි, සිබ්බනිය නම් මැහුම්කාරිය තණ්හාවයි.

- තවත් ස්වාමීන්වහන්සේනමක් ඉදිරිපත්වෙලා කියනවා එක අන්තයක් අතීතයයි, අනිත් අන්තය අනාගතයයි, මැද වර්තමානයයි.

- තවත් ස්වාමීන්වහන්සේනමක් ප්‍රකාශ කරනවා එක අන්තයක් සුඛ වේදනාවයි, අනිත් අන්තය දුක් වේදනාවයි, මැද අදුක්ඛමසුඛ වේදනාවයි, සිබ්බනිය නම් තණ්හාවයි.

- තවත් භික්‍ෂූන්වහන්සේනමක් ප්‍රකාශ කරනවා නාමය එක් අන්තයකි, රූපය අනිත් අන්තයයි, මැද විඥ්ඥාණයයි.
- තවත් භික්‍ෂූන්වහන්සේනමක් කියනවා ආධ්‍යාත්මික ආයතන හය එක් අන්තයකි, බාහිර ආයතන හය අනිත් අන්තයයි, මැද විඥ්ඥාණයයි.
- ඊළඟට තවත් ස්වාමීන්වහන්සේනමක් ප්‍රකාශ කරනවා සක්කාය එක් අන්තයකි, සක්කාය සමුදය අනිත් අන්තයයි, සක්කාය නිරෝධය මැදයි.

ඉතින් ඒ පිළිබඳව භික්‍ෂූන්වහන්සේලාගේ මේ මත වල අර්ථය කුමක්දැයි හරියටම පැහැදිළි නැති නිසා මේ භික්‍ෂූන්වහන්සේලා භාග්‍යවතුන්වහන්සේ හමුවට ගිහිල්ලා මේ අදහස් ප්‍රකාශ කරනවා. භාග්‍යවතුන්වහන්සේ වදාරනවා "මහණෙනි, පරියායෙන්, ඒ ඒ කරුණෙන් ඔබ හැමගේම කරුණු සුභාෂිතයි". ඒ කියන්නෙ නිවැරදියි.

"නමුත් මා තිස්සමෙත්තෙයිය කියන ප්‍රශ්නයේදී දේශනා කළේ **ස්පර්ශය එක අන්තයක් බවත්, ස්පර්ශ සමුදය අනෙක් අන්තය බවත්, මැද ස්පර්ශ නිරෝධය බවත්**". එලෙස භාග්‍යවතුන්වහන්සේ තම අදහස වදාරළා සිටිනවා.

"ඉතින් ඒ අනුව යම් භික්‍ෂුවක් මේ කරුණ තේරුම් ගත් පමණින්ම, අභිඥ්ඥා වශයෙන් විශිෂ්ට ඥානයෙන් දතයුත්ත දැන, පරිඥ්ඥා වශයෙන් පිරිසිඳ දතයුත්ත දැන මේ ජීවිතයේදීම දුක් කෙළවර කරනවා" කියන අදහසයි අවසානයේ ප්‍රකාශ වන්නේ.

ඉතින් පින්වතුනි මෙහිදී අපි **අවබෝධ කරගන්න ඕනෙ** මේ සූත්‍ර දේශනාවෙන් ප්‍රකාශවන '**මජ්ඣෙ පටිපදාව**' හෙවත් ඒ '**මැද**' පිළිබඳව, මධ්‍යස්ථය පිළිබඳව, '**මැදුම් පිළිවෙත**' පිළිබඳව **භාග්‍යවතුන්වහන්සේ ඒ ගාථා ධර්මයට අනුව 'අනුදැන වදාළ අර්ථය'**.

මෙහිදී අපි කල්පනා කරන්න ඕනෙ භාග්‍යවතුන්වහන්සේ

**මජ්ඣිමා පටිපදා** කියන වචනය ධම්මචක්කපවත්තන සූත්‍රයෙනුත් හෙළිදරවු කළා - **ආර්යඅෂ්ටාංගික මාර්ගය.** කාමසුඛල්ලිකානුයෝගය, අත්තකිලමතානුයෝගය කියන අන්ත දෙකෙන් මිදිලා මැදුම් පිළිවෙත වශයෙන් ආර්යඅෂ්ටාංගික මාර්ගය වදාළ බව අපි දන්නවා.

ඒ වගේම මේ මජ්ඣේ සූත්‍රයේ දේශනාවෙන ඒ ඒ කරුණු අපි තෝරාගත්තොත් අපට වැටහෙන්නට ඕනෙ එක් එක් භික්ෂූන්වහන්සේලා 'විවිධ වශයෙන් එහෙම අදහස්' ප්‍රකාශ කළත්,

**ඒවායේ 'අර්ථ වශයෙන් එකම තැනකට ගොණුවෙන බව'**

**-මේ 'මැද' කියන තැන-**

එතකොට පින්වතුනි මේ මජ්ඣේ සූත්‍රයේ පෙන්නුම් කළ ඒ ගාථාවෙ සඳහන්වෙන කරුණුවලට අනුව අපි පළමුවෙන්ම තෝරාගන්නට බලමු එක් භික්ෂූන්වහන්සේනමක් ප්‍රකාශ කළ -

**"එක් අන්තයක් තමයි <u>ස්පර්ශය,</u> අනෙක් අන්තය තමයි <u>ස්පර්ශ සමුදය,</u> <u>ස්පර්ශ නිරෝධය</u> මජ්ඣේ හෙවත් මැදයි"** යන්නෙහි අර්ථය.

**යම් කෙනෙක් මේ අවබෝධය ලැබුවොත්** ඔහුට භාග්‍යවතුන්වහන්සේ වදාරනවා **මහාපුරුෂයා** ය කියලා.

ඔහු **'සිබ්බනිය නම් මැහුම්කාරියගෙන්'** හෙවත් ඒ **'තණ්හාවෙන්'** සසර නැවත ගැටගැහෙන්නේ නැහැ කියන එකයි එයින් ප්‍රකාශ වන්නේ.

පින්වතුනි, අපි විශේෂයෙන් 'ජීවිතයට භාවනාවක් වශයෙන්' ධර්මය තේරුම්ගන්න උනන්දුවෙන පිරිස්. ඒ වගේම බුදුරජාණන්වහන්සේගේ දහමෙන් මේ ජීවිතයේම ප්‍රයෝජන ගත යුතුයි කියන අදහසින්, මේ ජීවිතයේම අඩුම වශයෙන් සෝතාපන්න ඵලයටවත් පත්විය යුතුයි කියන අදහසින් බණභාවනාවල යෙදෙන ගිහි පිරිස්, පැවිදි ස්වාමීන්වහන්සේලා බොහෝ සිටිනවා. ඉතින් ඒ නිසා,

**එදා භික්ෂූන්වහන්සේලාට යම් කර්මස්ථානයක් වුණා වගේම විදර්ශනා භාවනාවට, මේ ධර්ම කරුණු ටිකත් මේ ධර්මශ්‍රවනය කරන හැමදෙනාටම විදර්ශනා භාවනාවට බොහෝ උපකාරීවෙන කර්මස්ථානයක් වෙන්නට පුළුවන්.**

මේ ස්පර්ශය එක අන්තයක් කිව්වා, ස්පර්ශය සමුදය අනිත් අන්තය කියලා කිව්වා. පින්වතුනි, මේ ආයතන සම්බන්ධව අපි වටහා ගන්නකොට අපි තෝරාගන්නට ඕනෙ,

- මේ **ස්පර්ශය** කියලා දේශනාවෙ පෙන්නන්නෙ **ඇසත්, රූපයත්, විඤ්ඤාණයත් කියන** මේ **තිදෙනාගේ** ස්පර්ශයට.
- **ස්පර්ශ සමුදය** කියනකොට අපි තේරුම් ගන්නට ඕනෙ ඒ **ස්පර්ශ වෙන්න දායකවුණු හේතු. '*සළායතන' පච්චයා ඵස්සො*** ආදී වශයෙන් පෙන්නන හේතු පිළිබඳව අපි 'ස්පර්ශ සමුදය' කියන තැන තේරුම් ගන්නට ඕනෙ.

එතකොට, මෙහිදී අපි නුවණින් සිතා බැලුවොත් **මෙතැන පෙන්නන්නෙ මේ 'කොන් දෙක', 'අන්ත දෙක' නුවණින් අවබෝධ කළ යුතුයි** කියලා.

ඇස පිළිබඳව ඇසට ගැටෙන ගෝචර රූපය පිළිබඳව, කන පිළිබඳව කනට ගැටෙන ශබ්දය පිළිබඳව, ඒ වගේම ගැටීමෙන් හටගන්න ඒ චක්ඛු විඤ්ඤාණ සෝත විඤ්ඤාණ පිළිබඳව, ඒ වගේම නාසය හා ගන්ධ රූප පිළිබඳ, ඒ ගැටීමෙන් හටගන්න ගඳ සුවඳ දැනගන්න ඝාන විඤ්ඤාණ පිළිබඳ,... මේ ආදී වශයෙන් මේ

- **ආධ්‍යාත්මික ඉන්ද්‍රියන් සය** පිළිබඳවත්,
- **බාහිර ගෝචර** වෙන **හේතු** පිළිබඳවත්,
- ගැටීමෙන් හටගන්න **විඤ්ඤාණ** පිළිබඳවත්

නුවණින් අවබෝධ කළ යුතුයි.

ඇස කියලා කියන අවස්ථාව පින්වතුනි අපි දන්නවා **චක්ඛු ඉන්ද්‍රිය, චක්ඛු ප්‍රසාදය, චක්ඛු ආයතනය** ආදී වශයෙන් නම් වලින් හඳුන්වනවා. අපි පළමුවෙන් තේරුම් ගන්න ඕනෙ පින්වතුනි,

භාග්‍යවතුන්වහන්සේ මේ ආයතන පිළිබඳව දේශනා කරන තැන් වලදී නිරතුරුව වදාළා

"*චක්ඛුං භික්ඛවෙ අනිච්චා* - මේ **ඇස** මහණෙනි **අනිත්‍යයි.**

*රූපං භික්ඛවෙ අනිච්චං* - **රූපයද අනිත්‍යයි**" කියලා.

එතකොට, **අනිත්‍ය වෙන්නෙ මොනවද?**

මේ ඇසත් රූපයත්, කනත් ශබ්දයත් ආදී වශයෙන්... අපි පැහැදිළිව දන්නවා **ආධ්‍යාත්මික ආයතන, බාහිර ආයතන** සමස්ථයක් වශයෙන් ගත්තහම මේ **සතරමහාධාතු** බව. ඇහේ චක්ඛු ප්‍රසාද රූපය, සතරමහාධාතූන්ගේ ම කොටසක්.

සතරමහාධාතු කියනකොට පින්වතුන් කවුරුත් දන්නවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ වශයෙන් හඳුන්වනවා. පින්වතුනි, මහපොළවේ පස්, හිරු එළියේ උෂ්ණත්වය, වාතය, ඒ වගේම ජලය... මේ කාරණා හතර තමයි පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා කියන්නෙ.

එතකොට හිතලා බලන්න පොළොවේ ගහක් හැදෙනකොට, පොළොවේ රසය උරා ගන්න සියුම් මුල් වලින් ගහට අවශ්‍ය පොළොවේ පෝෂණය උරාගෙන, හිරුඑළියේ උණුසුමත් උපකාර කරගෙන, වාතයත් උපකාර කරගෙන, ජලයත් උරාගෙන, මේ ශාකයේ හැදෙනවා කොළ මල් ගෙඩි ආදී කොටස්. අනතුරුව, ඒවා දිරදිරා යනකොට, ඒවා නැසිනැසී යනකොට, නොනවත්වාම පෝෂණය උරාගනිමින් නැවත නැවත කොළ, මල් ආදී ඒ කොටස් හැදෙනවා.

ඒ ගෙඩි - පළතුරු ධාන්‍ය ආදී **ගස්වල සතරමහාධාතු** කොටස් ම අරගෙන, ඒවා ම අපි තම්බලා පිසලා ආහාර වශයෙන් ශරීරයට එක්කළහම ආහාර මාර්ගයේ ඇති සියුම් නාලිකා වලින් ඒවා උරාගන්නවා -අර සියුම් මුල් වලින් ගහට අවශ්‍ය පොළොවේ පෝෂණය උරාගත්තා වගේ.

ඒ **සතරමහාධාතූන්ගෙන්** හැදුණු කොටස් **ආහාර** වශයෙන් ගත්තහම, **ආහාරයේ කොටස්** වලින් **ශරීරයේ කොටස්**

හැදෙනවා අර වගේම.

ගහේ ගෙඩි මල් හැදුණා වගේ මේ ශරීරයෙත් කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, ඇට, ඇටමිඳුලු, හෘදයමාංස, අක්මාව, බඩදිව... හිස්මොළ ආදී ඔය කියන තද පඨවි කොටස් විස්සක රූප කලාපයෝ ගොඩනැගෙනවා. ඒ වගේම පිත, සෙම, සැරව, ලේ, දහඩිය, කඳුළු, වුරුණුතෙල්, කෙළ, සොටු, සඳමිඳුලු, මුත්‍රා ආදි වතුර කොටස්, **ආපෝ** ධාතුන් හැදෙනවා.

මොනවායින් ද හැදෙන්නෙ?
අපි ගන්න ආහාරය දායක වෙලා, වතුර උපකාර වෙලා, ආශ්වාස ප්‍රශ්වාසය උපකාර වෙලා. ඒ කොටස් දිරීමට පත්වෙලා අනතුරුව දිරාපත්වෙන මළ ශරීරය යළි මහපොළොවට එකතු වෙනවා.

මේක අපි තෝරාගන්න යන්නෙ ඇයි,

- **මේ 'ඇසත්' මේ 'ඇසට ගැටෙන රූපයත්' කියන මේ දෙපැත්තම 'සතරමහාධාතුන්' බව, සතරමහාධාතුන්ගෙන් වෙන් නොවුණු ස්වභාවය** අවබෝධ වන්නට.
- **ඒවායේ නිරන්තර ස්වභාවය** භාග්‍යවතුන්වහන්සේ වදාළේ **'අනිත්‍ය බව, වෙනස්වෙන බව'.**

දැන් මෙතන අපි තේරුම් ගන්න ඕනෙ එහෙනම් -

- **විවිධත්වයක් මේ ලෝකෙ දැක්කට, එලෙස ගන්නා විවිධ දේවල් සියල්ල සතරමහාධාතුන්ගෙන් 'වෙන්වෙලා නැති බව'.**
- සතරමහාධාතුන්ගෙන් වෙන්වෙන් කොටස් විදිහට සකස් වුණත්, **'සතරමහාධාතු වශයෙන් ගත්කළ මේවා එකක්' බව.**

## 'ඇති රූප' මායාව සිඳලනු පිණිස 'නොපවතින රූප' නුවණින් දැකීමට

පඨවි කියලා කියන්නේ අපත් අප අවට ඇති සියලු දේකමත් ඇති තද ස්වභාවය. තද කරන, කුඩු කරන දූවිලි කරන ස්වභාවය ලෙස හඳුන්වනවා. පඨවි ධාතුව කියනකොට මේ ශරීරයක ඇති පඨවියද, පස්වල පඨවියද, ගහක තියෙන පඨවි ස්වභාවයද, රත්‍රන්වල තියෙන පඨවි ස්වභාවයද.. ආදී වශයෙන් විවිධව බලන්නෙ නැහැ. අපි දකින්නෙ - සියලු දේවල තියෙනවා පඨවි ධාතුව, **තදකරන කුඩුකරන ස්වභාවය - ක්‍රියාකාරී ස්වභාවයක්.**

ඒ වගේම, ආපෝධාතුව - **ගලන, වැගිරෙන, දියකරන ස්වභාවය.** වායෝ ධාතුව - මේ **හමන, පිම්බෙන, සෙලවෙන ස්වභාවය.** තේජෝ ධාතුව - **දවන, තවන, දිරවන, පැසවන ස්වභාවය. (ක්‍රියාකාරී ධාතු ස්වභාවයන්)**

මේ ධාතු හතර තමයි ලෝකෙ ඇති සෑම දේකම අන්තර්ගත වන්නේ.

මේ හතර *** 'අඩුවැඩි'** වශයෙන්, *** 'එකක් අනෙකෙන් වෙන්කළ නොහැකි සේ'** - අවිනිර්භෝගී භාවයකින් පවතිනවා.

අපට ප්‍රකටව තද දෙයක්, ඒ කියන්නෙ පඨවි ධාතුව ප්‍රකටව පෙනෙන්නෙ එහි පඨවි ධාතුව වැඩියෙන් ඇති නිසයි, අනිත් ධාතු තුන නැතුවා නෙමෙයි. ආපෝ ස්වභාවය වැඩිපුර පවතින නිසයි අපට වතුර වගේ, ගලන වැගිරෙන සේ පෙනෙන්නෙ. වායෝ ධාතුවෙත් අනිත් තුන අන්තර්ගතයි, නමුත් වායෝ ධාතුව වැඩි නිසා වාතය ලෙස පෙනෙනවා. තේජෝ ධාතුව වැඩි නිසා අනිත් ස්වභාවයනුත් සමග, තේජෝ බව ප්‍රකටව පෙනෙනවා.

**නමුත්, මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන මේ ධාතූන්ගේ ස්වභාවය නම් - නිරන්තරව වෙනස්වීම.**

**ඒ ධාතු යන වචනයේ *'අර්ථය'* තුළ ඇතුළත්ව ඇත්තේ -**

***ස්ථිරව ඇති බවක් නෙමෙයි, 'ක්‍රියාත්මක' ස්වභාවයක්.***

ඒකයි භාග්‍යවතුන්වහන්සේ වදාළේ **'මේ රූපය නම් මහණෙනි අනිත්‍යයි, ක්‍ෂණ භංගුරයි, වහා ඉපිද නැසෙන සුලුයි'. සංඛත ධර්මයන්ගේ ස්වභාවය, හේතුප්‍රත්‍යයන්ගෙන් හටගන්න සෑම දේකම ස්වභාවය** භාග්‍යවතුන්වහන්සේ වදාළේ *උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති* -හටගැන්මක් පෙනේ, නැසීමක් පෙනේ, ඒ අතර දිරීමක් පෙනේ, **පැවැත්මක් නොපෙනේ.**

***'වෙනස්වීමක්ම පෙනේ, පැවැත්මක් නොපෙනේ'.***

**එතකොට, මේ සෑම දෙයක්ම නිරන්තරව වෙනස්වෙනවා.**

**මේ වෙනස්වීම *බාහිරව ඇහැට පෙනෙන්නෙ නැහැ,***

***'නුවණින්' දැකිය යුතුයි.***

*පූජනීය ගලතර ධම්මරක්ඛිතතිස්ස ස්වාමීන්වහන්සේගේ ධර්මදේශනා ඇසුරෙනි....*

'ඇති රූප' මායාව සිඳලනු පිණිස 'නොපවතින රූප' නුවණින් දැකීමට

දියසුළියක් කැරකෙන තැනදි - උඩහින් වතුර ඇවිල්ලා, සුළිය හරහා කැරකිලා, පහලට යනවා. 'දියසුළිය' කියන තැන වෙනම 'දියසුළිය' කියන නමකින් හැඳින්නුවත්, **එහි ඇත්තෙත් උඩහින් එන වතුරමයි. පහලට යන්නෙත් වතුරමයි. ඒ වගේම - මොහොතක් මොහොතක් පාසාම අළුත්** දියසුළියක්.

ඒ වගේ - **සතරමහාධාතුන්ගෙන්** සකස්වුණ, බාහිරෙන් ගන්නා ආහාරපානාදිය නොනැවතීම **දිරවමින්, පැසවමින්** ශරීරය නමැති හැඩය ගන්නවා, කෙස් ලොම් නිය දත් කෙළ සොටු මුත්‍ර ආදී **හැඩ ගන්නවා**. ඒවා **දිරමින් නිරන්තරයෙන්ම** බාහිරයට එක්වෙනවා.

එහෙනම් *ශරීරයයි, බාහිරයයි* වෙන් වෙලා නෑ.

***වෙන් කළ නොහැකි එකම ක්‍රියාකාරී ස්වභාවයක්.***

එහෙම නම් මේ 'කය' - **නිත්‍යව පවතින කයක් නෙමෙයි. නිරන්තරව අනිත්‍යවන මේ කය අපි 'නුවණින්' අවබෝධ කරන්න ඕනෙ.**
ඕනෙම දේකට නමක් කියනකොට අපට එන්නෙ නිත්‍ය හැඟීමක්. ඒ 'කය' කියන '**සම්මුති** වචනයක් පැනෙව්වත්', ***කය නිත්‍ය නැහැ.***

අර දාර්ශනිකයෙක් කියනවා 'ගඟ' කියන්න උත්සාහ කළාට, **'ගඟක්' නම් කරන්න පනවන්න කාලයක් නැහැ** - 'ගඟ' ගලන නිසා. 'ගඟ' කියලා **නම්කරන කොට** - ඒ වතුර **එතැනින් ඉවත්වෙලා.**

ඒ වගේ, අපි හිතන්න ඕනෙ - **කය තුළ නිත්‍ය වූ අවස්ථාවක් නැති බව. මොහොතක් මොහොතක් පාසා මේ ශරීරය ඉපිද නැසෙන බව.**

ඒකට හොඳම සාක්ෂිය තමයි මේ ආශ්වාස ප්‍රශ්වාස සිද්ධිය. **කාය සංඛාරය ආශ්වාස වාතය යි** කියලා බුද්ධ දේශනාවෙ තියෙනවා. නැසෙන නැසෙන **එක් එක් ක්ෂණයක් ගානෙ**, රූප ආපහු රාශි **කරන්න ආශ්වාස වාතය හේතු වෙනවා, ආහාරය හේතු වෙනවා.**

මේ 'වෙනස්වෙන ස්වභාවය' නුවණින් අවබෝධ කරන විට,

පවතින ශරීරයක් නෑ, *'පවතින දෙයක් නෑ'.*

***'නිත්‍ය භාවයක් දෙන්න බෑ' මේ ලෝකෙ 'කිසිම දේකට'.***

ඒකයි භාග්‍යවතුන්වහන්සේ වදාළේ - 'රූපය අනිත්‍ය යි' කියලා.

අනිත්‍ය දේට නිත්‍යක් දෙන්නෙ කොහොමද? ***'මෙය යි' කියලා කියනකොට එය වෙනස් වෙලානෙ.*** **ඒ නිරතුරුව සිද්ධවෙන ක්‍රියාවලියක්නෙ.**

ඒ **නිරන්තරව අනිත්‍යවන 'රූප'** - **'මම කියා ගන්න බැරි බව'**

'නුවණින්' අවබෝධ කරන්න ඕනෙ.

*පූජනීය ගලතර ධම්මරක්ඛිතතිස්ස ස්වාමීන්වහන්සේගේ ධර්මදේශනා ඇසුරෙනි....*

ස්වාමීන්වහන්සේලා මේ ගැන දේශනා කරන අවස්ථාවල පැහැදිළි කරනවා, මැටි ගොඩක් අරගෙන වළං බවට පත්කළහම ඒ 'වළං ගොඩේ මැටි දැකිය නොහැකි වුවත්', ඒ සියලු 'වළං තුළ අන්තර්ගත මැටි බව' හා මැටි වෙනම දැකිය නොහැකි බව. මෙන්න මේ වගේ -

- **මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ** කියන හතර තමයි පින්වතුනි මේ ලෝකයේ මේ හැදිලා තියෙන **සියලු දේම තුළ අන්තර්ගත.**
- **ඒවා නිරන්තරව විපරිනාම වෙනවා, වෙනස් වෙනවා.**

එහෙම නම් -

මේ **මොහොතක් පාසා** වෙනස්වෙන ඇහැකට, චක්ඛු ප්‍රසාදයට, **මොහොතක් පාසා වෙනස්වෙන ගෝචර රූපයක්** ගැටුණහම මොහොතක් පාසා වෙනස්වෙන ආලෝකයක් හමුවේ, **චක්ඛු ප්‍රසාදයේ ඇතිවෙනවා** - **'ප්‍රතිබිම්බයක්'.**

කණ්නාඩියක් ඉදිරියට ගියහම ජායාව එහි පිළිබිඹු වෙනවා වගේ, ඇහේ ප්‍රතිබිම්බයක් සැකසෙනවා මොහොතින්ම.
ඒ ප්‍රතිබිම්බය වගේ තමයි - ප්‍රතිබිම්බය නෙමෙයි, මේ උපමාවක් කියන්නෙ 'ඒ ආශ්‍රයෙන්' තේරුම් ගන්න - ආලෝකයේ උදව්වෙන් ඉදිරියෙන් ඇති වර්ණසටහනෙහි ප්‍රතිබිම්බය ඇහේ (චක්ඛු ප්‍රසාදයේ) පහළවෙනවා. ඒ ප්‍රතිබිම්බය පහළවෙනවාත් එක්කම,

- **ඒ ප්‍රතිබිම්බය පහළවෙන්න දායක වුණ 'ඇසත් අනිත්‍ය වන නිසා',**
- **'ගැටෙන රූපයත් අනිත්‍ය වන නිසා'** - මොහොතක සිද්ධියක් නිසා ඇතිව නැතිවෙන,
- **ආලෝකයත් ඇතිව නැතිවෙන** මොහොතක සිද්ධියක් නිසා,
- **'මේ හේතු තුනේ ඵලය'** වශයෙන් හටගත්ත ඒ **'ප්‍රතිබිම්බයද' එහිම නිරුද්ධභාවයට පත්වෙනවා. නැසිලා යනවා.**

එතකොට මේ චක්ඛු විඤ්ඤාණය කියන්නෙ මේ වගේ හිතන්න ඕනෙ - '**චක්ඛු විඤ්ඤාණයෙන් දැනගන්නෙ අර ප්‍රතිබිම්බය වැනි අවස්ථාව.**

**ඇසත් රූපයත් ගැටීමෙන්** භාග්‍යවතුන්වහන්සේ වදාළා චක්ඛු **විඤ්ඤාණයක් හටගන්නවා. ඒ -**
**'හේතුප්‍රත්‍යයෙන් හටගන්න ඵලය'** හෙවත් **චක්ඛු විඤ්ඤාණය.**

කනත් ශබ්දයත් ගැටීමෙන් සෝත විඤ්ඤාණයක් හටගන්නවා. දැන් ඔය විඤ්ඤාණයෙන් දැනගන්න ලැබුණේ ඒ ඇසත් රූපයත් ගැටීමෙන් පහළ වූ 'ප්‍රතිබිම්බය', වස්තුවේ ප්‍රතිබිම්බය. ශබ්දයේ, ගන්ධයේ, රසයේ.., ඔය විදිහට 'ඒ ඒ හේතුන්ගේ ඵලය'.

**විඤ්ඤාණය** ගැන අපි තෝරාගනිමු ඉස්සෙල්ලම. විඤ්ඤාණය කියන අවස්ථාව පින්වතුනි මේ ඇහැට ඉදිරියෙන් අපට දිස්වෙන, ඇහැ 'ප්‍රත්‍යයෙන් හටගෙන තියෙන මේ චක්ඛු විඤ්ඤාණය භාග්‍යවතුන්වහන්සේ වදාළේ -

*මායූපමංච විඤ්ඤාණං* - **'මායාවක්'.**

**යථාර්ථයක් එහි නෑ. ඇත්තක් එහි නෑ.**

නමුත් අපි,

මේ **'විඤ්ඤාණය ම'** ඇස **වශයෙන් පිළිගන්නවා.**

**'විඤ්ඤාණය ම රූපය කරලා' පිළිගන්නවා.**

නිතර භාවනා කරන අය දන්න උදාහරණයක් තියෙනවා, ඒදණ්ඩෙ යන බල්ලා වතුර දිහා බැලුවහම එයාගෙ හෙවනැල්ල වැටෙනවා. නමුත් මේ සුනඛයා දකින්නෙ තවත් සුනඛයෙක්, **පිළිගත්තෙ** තවත් සුනඛයෙක් කියලා.

එතකොට අපට පෙනෙනවා ඒ එයාගෙ විඤ්ඤාණයේ - එයත්, එයා දකින බල්ලාත් 'අතර ඇති කොටස' විඤ්ඤාණය. මේ **විඤ්ඤාණය** පින්වතුනි **ඇස වශයෙන්** පිළිඅරගෙන තියෙනවා. විඤ්ඤාණය **වස්තු වශයෙන් පිළිඅරන් තියෙනවා.** ඒකනෙ එයා බල්ලෙක් කියලා හිතාගත්තෙ - ඡායාවට.

මෙන්න මේ වගේ, ඇසෙහි පතිතවෙන **ප්‍රතිබිම්බය ප්‍රත්‍යවෙලා,** අපි එය 'වස්තුවක් සේ' දකිනවා. අපි දකිනවා කිව්වොත් වැරදියි,

අපි දකිනවා නොවෙයි,

**ඒ අවිද්‍යා සහගත අනුශයන්ගේ සංග්‍රහය ලැබිලා,**

**ඒ ප්‍රතිබිම්බය 'වස්තුවක් සේ' පිළිබිඹු වෙනවා.**

**'වස්තුවක් සේ' පිළිගැන්වෙනවා.**

**ඇයි එහෙම පිළිගැන්වෙන්නෙ?**

පින්වතුනි, කලින් තෝරා-බේරා ගත්ත ධර්ම අවබෝධයක් නැතිකම නිසා, මේ **'ස්පර්ශයත්, ස්පර්ශ හේතුත්' කියන මේ සිද්ධිය සම්බන්ධව නොදන්න නිසා.**

අපි නැවතත් බලමු. ඇහැත්, ඇහැට ගැටෙන රූපයත්, ඒ දෙක ගැටුණහම චක්ඛු විඤ්ඤාණයක් ඇති වුණා. දැන් **'මේ තිදෙනාගේ ස්පර්ශය'** කියලා මෙතන අදහසක් ප්‍රකාශ වුණා.

දැන් ඔතන ස්පර්ශය වෙන්නට හේතු දිහා බැලුවහම,

**'හේතු වල' - 'ස්පර්ශය නැහැ'.**

උදාහරණයක් වශයෙන් හිතන්න, යම් කෙනෙක් කඩේකට ගිහින් තේ එකක් ඉල්ලුවොත්, එහෙ තියෙන්නෙ උණුවතුර, තේකොළ, සීනි. මේ 'හේතු වල' - 'තේ එකක් නෑ'. නමුත් 'ඒ හේතු එක්වූ විටෙක' - එහි සීනි වෙන්කරන්න බෑ, එහි තේකොළ වෙන් කරන්න බෑ, උණුවතුර වෙන් කරන්න බෑ. මේවායේ 'එකතුව' අර තේ එක වශයෙන් අපි දකිනවා. මේ උපමාවක් කියන්නෙ යන්තම් අපි අදහස් කරන දේ ප්‍රකාශ කරගන්න.

මෙන්න මේ වගේ **ස්පර්ශ සමුදය** කියන දිහා නුවණින් බැලුවොත්

සතරමහාධාතුන්ගෙන් හැදුණු **ඇසෙහි** ඇත්තේ **අනිත්‍ය** ස්වභාවයක්,

ඇහැට ගැටෙන **ගෝචර** වල ඇත්තේත් **අනිත්‍ය** ස්වභාවයක්.

ඒ වගේම **ආලෝකයේ** ඇත්තේත් **අනිත්‍ය** ස්වභාවයක්.

ඒ වගේම **විඤ්ඤාණයේ** ඇත්තේත් **අනිත්‍ය** ස්වභාවයක්, වහා ඇතිව නැතිවන ස්වභාවයක්.

**මේ 'ස්පර්ශ හේතු' එක්වෙලා 'ස්පර්ශ වුණහම'**, එතෙන්ට අපි කියන්නෙ නැහැ හේතු කියලා. අපි කියන්නෙ එතෙන්ට **'ඵලය'**

කියලා.

දැන් එතකොට ඒ 'ස්පර්ශ හේතු' වහා එක්ව නිරුද්ධ වන නිසා, අනිත්‍ය වන නිසා, අර 'ස්පර්ශයත් එහිම නිරුද්ධවෙලා යනවා'.

*'ස්පර්ශ වෙනවාත් සමගම, ස්පර්ශ නිරෝධය' .*

එතකොට - එක් අන්තයක් ස්පර්ශය,
අනිත් අන්තය ස්පර්ශ සමුදය.
මේ ස්පර්ශ නිරෝධය දකිනවා නම්,

*'ස්පර්ශ වන හේතුත් සමගම නිරුද්ධ වන ආකාරය' දකිනවා නම්* යම් කෙනෙක්, පින්වතුනි

තවදුරටත් අර සිබ්බනිය වූ මැහුම්කාරිය හෙවත් තණ්හාවට පුළුවන් කමක් නෑ මේ 'හේතු එකතු කරලා' - 'අර ස්පර්ශය නිසා' විඳීම් වලට යන්නට.

විඳීම් වලට ගියොත් - තණ්හාව උපාදානය වෙලා, භව හෙවත් කර්ම රැස් වෙනවා.

එසේ වන්නට ඉඩ ලැබෙන්නෙ නැහැ-
'ස්පර්ශ නිරෝධය නුවණින් දැක්කා නම්'.

නමුත්, ඒ *'ස්පර්ශය නිරෝධයට යටින් ඇති අවිද්‍යා සහගත ස්වභාවය'* නිසා,

'ස්පර්ශ නිරෝධය නොදැක්කොත්' - වහාම වෙන්නෙ මොකක්ද,

ඒ ස්පර්ශය කෙරෙහි සතුටු වෙනවා.

*චක්ඛු සම්ඵස්ස* වේදනාවට අහුවෙනවා. *සොත සම්ඵස්ස* වේදනාවට අහුවෙනවා.

ඒ 'විඳීමට' අහුවෙලා, 'තණ්හාව ඇතිවෙලා - උපාදාන, භව' වලට යනවා.

නමුත් එසේ වන්නේ නැහැ,

'ස්පර්ශයත්, ස්පර්ශ සමුදයත්' කියන අන්ත දෙක
නුවණින් අවබෝධ කළහම,
මැද - 'ප්‍රඥාවෙන් නොඇලෙනවා'.

ඇයි?

***එකෙනෙහිම 'ස්පර්ශ නිරෝධය' වන නිසා.***

අපි ගනිමු, තවත් ඒ භික්ෂූන්වහන්සේ නමක් කළ ප්‍රකාශයක්...

**එක් අන්තයක් තමයි ආධ්‍යාත්මික ආයතන, අනිත් අන්තය තමයි බාහිර ආයතන, මැද 'ඒ හේතු ගැටීමෙන් හටගන්න' විඤ්ඤාණය.**

**ඒ කොන් දෙක 'නුවණින් අවබෝධ කොට' මැද 'ප්‍රඥාවෙන් නොඇලෙන්න'.**

දැන් මෙහිදීත් අර වගේම තේරුම්ගන්න බලන්න. **ඇස, කන, නාසය, දිව, කය, මනින්ද්‍රිය කියන ආයතන හය** ගැනම බැලුවහම අපි 'නුවණින්' අවබෝධ කරන්න ඕනෙ - මේ **ආධ්‍යාත්මික ආයතන නිරන්තරව වෙනස් වෙන නිසා,** ඒ වෙනස්වෙන **ආධ්‍යාත්මික ආයතන වලට, බාහිර ආයතනය කියන** ගෝචරය වූ බාහිර **රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය,** ඒ වගේම **මනසට ධම්ම** - මේ කියන හේතු ගැටුණහම, ඒ හේතු ගැටෙන මොහොතෙහිම...,

ඒ අනිත්‍යවෙන ඇහැකට අනිත්‍යවෙන රූපයක ප්‍රතිබිම්බය වැටෙනවා ආලෝකයත් එක්ක. ඒ 'අනිත්‍යවෙන හේතු' නුවණින් අවබෝධ කළහම - ඒ කියන්නෙ **ඇසත්, රූපයත්** නුවණින් අවබෝධ කළේ කොහොමද අපි - ඉස්සෙල්ලත් මතක් කළා, මේ **සතරමහාධාතු ස්වභාවයෙන්** හැදුණු මේ **හේතු නිරන්තරව වෙනස් වෙන නිසා,** ආලෝකයත් නිරන්තරව වෙනස්වෙන නිසා, ඒ ප්‍රතිබිම්බයත් - ඒ ඒ හේතුන්ගෙන් හටගන්නා ඵලය - '**හේතු නැසෙන නිසා ඵලයත් එහිම නිරුද්ධ වෙනවා**'.

ඒ නිසා පින්වතුනි, **කොන් දෙක හෙවත් මේ අන්ත දෙක නුවණින් අවබෝධ වෙනකොට** - 'මැද ප්‍රඥාවෙන් ඇලෙන්න බෑ'.

කොන් දෙකේ - **චක්ඛු ප්‍රසාදයේ** හා රූපයේ 'අනිත්‍ය **ස්වභාවය'** පෙනෙන විට, එහෙනම් 'මේ ඇලෙන්නේ **විඤ්ඤාණයට' බව දකිනවා.** එක්ෂණිකව අනිත්‍ය වන චක්ඛු

ප්‍රසාදය හා රූපය ප්‍රත්‍යව හටගත්ත විඤ්ඤාණය ද ඒ සමගම නිරුද්ධ වන බව දකිනවා. ඒ නිසා -

**'ප්‍රඥාව, නුවණ, අවබෝධය නිසාම' අපට**

**ඒ 'විඤ්ඤාණයට ඇලෙන්න බෑ'.**

**'විඤ්ඤාණය' කිව්වෙ - 'හේතුන්ගෙන් හටගත්ත ඒ ඵලය'.** එතකොට ඇහෙන් දකින දෙය, ඔතන 'දෙය' කියන්නට බැහැ. සම්මුති වශයෙන් අපි එහෙම කියනවා, නමුත් ඔතන

-ඒ ඇසේ හටගත්ත 'ප්‍රතිබිම්බය' තමයි අපි **'දෙයක් සේ' පිළිගන්නෙ.**

හරියට මෙහෙම හිතන්න, යම්කිසි හේතු දෙකක් එකනෙකට ගැටෙනකොට, අපි හිතමු අත්දෙක එකිනෙකට ගැටෙනවා කියලා. අත්දෙක එකිනෙකට ගැටෙන කොට, ශබ්දයක් පැනනගිනවා. ඒ ශබ්දය ඒ ඒ අත්වල තිබුණ ඒවා නොවෙයි. **කොහේවත් සැඟවිලා තිබිලා ඒ මොහොතට පහළවුණත් නොවෙයි.** ගැටෙන්න ඉස්සර ඒ ශබ්දය කොහෙවත් තිබුණෙත් නෑ. ඒ වගේම **ගැටුණට පස්සේත්** ඒ ශබ්දය **කොහාටවත් ගියෙත් නෑ. අතීතෙටවත්, අනාගතයටවත් කොහාටවත් ගියේ නෑ.** ඒ **'ගැටීමත් එක්කම'** ශබ්දයක් **පැනනැංගා.** ඒ ශබ්දය

**'එකෙනෙහිම නිරුද්ධ වුණා, එකෙනෙහිම නිරුද්ධ වුණා'.**

එතකොට ඒ **නිරෝධය හෙවත්** ඒ **නැතිවීම** දැක්කා **නම්** ඔතැනදි අපි **අන්තයකට යන්නේ නෑ.** ඒ කියන්නෙ,

**'ශබ්දය ඇත' යන අන්තයකට යන්නෙත් නැහැ,**

**'ශබ්දය නැත' යන අන්තයකට යන්නෙත් නැහැ.**

දැක්කෙ මොකක්ද?

**හේතුන්ගෙන් හටගත්තා ඒ ශබ්දය** - සෝත ප්‍රසාදයත්, ශබ්ද රූපයත් එකිනෙකට ගැටීමෙන් ශබ්දයක් පැනනැංගා,

**සෝත විඤ්ඤාණය ඒ ශබ්දය දැනගත්තා.**

**ඒ ශබ්දය එහිම නිරුද්ධ වුණා.**

ඒ එකෙනෙහිම නිරුද්ධ වුණ ශබ්දය -

**නිරුද්ධ වුණා ඉතුරු නැතුවම.**

ඒ බව 'නුවණින් අවබෝධ වුණොත්' පින්වතුනි,

ඒ ශබ්දය අරහයා අපිට

**මෙනෙහි කරන්න ඉතුරු වෙච්ච දෙයක් නෑ.**

**'මෙනෙහි කරලා' ඒ පිළිබඳ රාගය, එහෙම නැතිනම් ද්වේශය, ක්‍රෝධය, තරහ, ඊර්සියාව, වෛරය ආදී දේවල් එකතු කරන්න බෑ.**

**හේතුව - 'ඒ ගැටීමත් එක්කම නිරුද්ධ වෙච්ච නිසා'.**

ඒ වගේම ගන්ධය පිළිබඳ බලන්න. නාසය හෙවත් ඝාන ඉන්ද්‍රිය නිරන්තරව වෙනස් වෙන එකක්, අනිත්‍ය වෙන එකක්. ඒ වගේම ගන්ධ රූපයත් ඇතිව නැතිවෙන එකක්. ගන්ධ රූපයක් වාතයෙන් ගෙනැවිල්ලා මේ නාසයේ ප්‍රසාදයේ තැවරෙනකොට **'ඝාන විඤ්ඤාණයක්'** පහළවෙනවා, හෙවත් **ගඳසුවඳ** දැනගන්න **හිතක්** පහළ වෙනවා.

එතැනත් බලන්න අර වගේම, **නුවණින් අවබෝධ කළහම මේ අන්ත දෙක, අන්ත දෙකේ** සැබෑම **ස්වරූපය** -

**නාසය - ඝාන ප්‍රසාදය** හැදිලා තියෙන්නෙත් අර මුලින් සඳහන් කළ වෙනස්වෙන සතරමහාධාතුන්ගෙන්. ඒ වගේම **ගන්ධ** රූපයෝ හැදිලා තියෙන්නෙත් **සතරමහාධාතුන්ගෙන්.**

**ඒ ගන්ධ රූපයෝ කොහේවත් තිබුණට ගඳක් හෝ සුවඳක් කියලා අපට කියන්න** බැහැ, **'නාසයත් එක්ක යි' ඒක ගන්ධයක් වෙන්නෙ.** නාසයට ගැටිලා, ඝාන විඤ්ඤාණය පහළවෙලා, **සුවඳක් හෝ ගන්ධයක් බවට එය පත්වෙන්නෙ.**

එතකොට ඒ හේතු ප්‍රත්‍යයෙන් ඒ **'ඝාන විඤ්ඤාණය' - ගඳ හෝ සුවඳ** දැනගන්න **සිතක් පහළවුණා. ඝාන විඤ්ඤාණය එහිම නිරුද්ධ වුණා.**

**කොන් දෙක නුවණින් අවබෝධ කොට,**

**මැද ප්‍රඥාවෙන් නොඇලෙනවා.**

**'ඒ ගන්ධය නිසා හටගත්ත ඝාන විඤ්ඤාණය', නැත්නම් ඒ ස්පර්ශයට අපි එකතුවෙන්නෙ නැහැ,**

**ස්පර්ශය එකෙනෙහිම නිරුද්ධවෙලා යන නිසා,**

**ඒ හේතු තුනේ නිරෝධයෙන්.**

ඒ වගේම දිව සම්බන්ධවත් බලන්න. ජිව්හා ප්‍රසාදයට, නැත්නම්

දිවට රසයක් තැවරෙනවා. ඒ දිවෙහි තියෙන තෙතමනය ප්‍රත්‍ය වෙලා, දිවත්, රසය රූපයත් ප්‍රත්‍යයෙන් ජිව්හා විඤ්ඤාණයක් පහළ වෙනවා. ඒ ජිව්හා විඤ්ඤාණය පහළවෙන්න හේතු වුණ දිවත්, රස රූපයත් පිළිබඳව නුවණින් සිතා බැලුවහම අපි දකිනවා ඒ ජිව්හා ප්‍රසාදය වෙනස්වෙන සතරමහාධාතුන්ගෙන් හැදිච්ච එකක්.

ඒ වගේම ජිව්හා ප්‍රසාදයට ගැටුණු රසය රූපයෙහි මේවා තිත්ත ද, මේවා ඇඹුල් ද, මේවා පැණිරස ද කියලා දැනගන්න බෑ දිවේ නොගැටී. **ඒවයේ එහෙම එකක් නෑ.**

සීනි තිබුණට ඒ ඒ තැන්වල, ඒවා පැණිරසද කියන්න ඒවා දන්නෙ නැහැ. 'දිවත් එක්ක යි' ඒක පැණි රහක් වෙන්නෙ.

එතකොට '**පැණිරහ කියන්නෙ - සිතක්**'.

එතකොට බලන්න, ඒක **ජිව්හා විඤ්ඤාණයක්.**

**ඒ තිදෙනාගේ ස්පර්ශයෙන් තමයි එතැන විඳීමකට යන්නෙ.** එතකොට ඒ '**පැණිරසද, තිත්ත රසද,** ඇඹුල් **රසද ආදී වශයෙන් මේ ස්පර්ශ වෙනවාත් එක්කම' තමයි විඳීමක් හටගන්නෙ.**

ඒ '**හේතු' නිරන්තරව අනිත්‍ය වෙන නිසා ම** ඒ 'දැනගත්ත **සිතත්' *එකෙනෙහිම* නිරුද්ධවෙලා යනවා.** ඒ ජිව්හා ප්‍රසාදය නිසා ඒ රස රූප තැවරෙන කොට ඇතිවෙච්ච 'ඒ රසය පිළිබඳව දැනගැනීම' එහිම නිරුද්ධ වෙලා යනවා.

ඒ වගේම කාය ප්‍රසාදයත්, එයට ගැටෙන හේතු වූ ස්පර්ශ රූපත් ස්පර්ශයෙන් කාය විඤ්ඤාණ පහළ වෙනවා. ඒ කාය විඤ්ඤාණයත් හේතු සමගම පහළවෙලා, හේතු සමග නිරෝධයට පත්වෙනවා.

ඒ වගේම පින්වතුනි, **මනසත්,** **මනසට** ගැටෙන 'ධම්ම හෙවත් **අරමුණු'** - මේ මනින්ද්‍රියේ හේතු ගැටෙන කොට, 'ධර්මාරම්මන හෙවත් මනසේ පහළවෙන අරමුණු' ගැටීමත් එක්ක **මනෝ විඤ්ඤාණයක්** පහළ වෙනවා. ඒ අරමුණ දන්නෙ නැහැ ඒ අරමුණේ තියෙන්නෙ රාගයද, ක්‍රෝධයද, ඊර්ෂ්‍යාවද, වෛරයද නැත්නම් සතුටද, අසතුටද, නැත්නම් ගෙදර ගැන අරමුණක්ද....

- **ඒ අරමුණ - වෙනම ස්වභාවයක්,**
- **මනස - වෙනම ස්වභාවයක්.**
- **මේ දෙක එකිනෙකට 'ගැටෙන කොට යි'**

**'මනෝ විඤ්ඤාණයක්' පහළ වෙන්නෙ.**

දැන් මේ වෙලාවෙ අපට පුංචි කාලෙ පාසැල් ගිය ඒවා මතක නෑ. නමුත් මේ මතක් කළ වහාම අපට සිහිවුණා.

**සිහි වුණේ කොහේ තිබිලද?**

ඒ වගේ බලන්න ජීවිතේ විවිධ සිද්ධි.

තිබුණේ මෙතැනයි කියලා අපට තිබුණ තැනක්, **නිශ්චිතව තිබුණ තැනක් නැහැ. හැබැයි 'හේතුවක් ව' පවතිනවා.**

අපේ භාෂාවෙන් අපි මතකය කියලා කියනවා.

නමුත් මේ '**හේතු**' ගැටෙනකොට යි අර **මනින්ද්‍රියේ, මනසේ ඒ මනෝවිඤ්ඤාණ පහළවෙන්නෙ.**

**මනෝවිඤ්ඤාණ කියන්නෙ - මනසේ මැවෙනවා.**

අපේ පාසැල ආදිය මැවෙනවා. මේ වගේ හේතු මැවෙනවා.

**මැවුණට - එතැන පාසැලක් නෑ.**

***'විඤ්ඤාණය කියන්නෙ මායාවක්'***

කියලා භාග්‍යවතුන්වහන්සේ වදාළා.

එතකොට මේ ගැන අපි තේරුම් ගන්න ඕනෙ මේ විදිහට. මේ ආයතන හයම සම්බන්ධව මේ අන්ත දෙක නුවණින් අවබෝධ කළහම, එක අන්තයක් තමයි **ආධ්‍යාත්මික ආයතන, බාහිර ආයතනය** තමයි රූපය, ශබ්දය, ගන්ධය ආදී වශයෙන්.....,

**'මේ සියල්ලක්ම සතරමහාධාතූන්' වශයෙන් නුවණින් අවබෝධ කරන කෙනා,**

- **එහි** යථාර්ථය දකින්නෙ වෙනස්වෙන බව. **නිරන්තරව අනිත්‍ය වෙන බව.**
- **'අනිත්‍ය වෙන හේතු දෙකක්** ගැටුණහම' ඇතිවෙන **'ඵලයත් තියෙන්නෙ නෑ',**

**අනිත්‍ය වෙලා යනවා, නිරුද්ධ වෙලා යනවා.**

ඒ නිසා ඇස හා රූප ප්‍රත්‍ය වෙලා හටගත්ත ඒ චක්ඛු **විඤ්ඤාණය**, රූප දැනගන්න **හිත** - **එහිම හටගන්නවා, එහිම නිරුද්ධ වෙනවා.** සෝත ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් හටගත්ත සෝත විඤ්ඤාණය එහිම හටගන්නවා, එහිම නිරුද්ධ වෙනවා.

මෙන්න මේ නිරෝධය පින්වතුනි මේ විදිහට අවබෝධයක් කළහම,

***'හේතු, ඵල, නිරෝධයක්' අවබෝධ කළහම,***

අපිට 'අතීතයෙන් ආවා' කියලා ගන්නත් බෑ, 'අනාගතයට යනවා' කියලා ගන්නත් බෑ,

**'වර්තමානයෙහි ම'** හේතුප්‍රත්‍යයෙන් හටගත්තා, වර්තමානයෙහි ම ඒ හේතු නිරෝධයෙන් නිරුද්ධ වුණා.

***'හේතු නිරෝධයෙන්'*** **නිරුද්ධ වුණා.**

මේ මැද, මජ්ඣෙ සූත්‍රයේ විශේෂයෙන් පැහැදිළි වෙන්නෙ **'මේ මැදුම් පිළිවෙත'** පිළිබඳව. **මේ මැද තේරුම් ගත්තොත්** යම් කෙනෙකුට මේ **මජ්ඣෙ සූත්‍රයේ පෙන්නුම් කරන** -

**ඔහු** ***'මධ්‍යම ප්‍රතිපදාවෙ'*** **යන්නෙක්.**

**ඔහු 'අන්තයකට යන්නෙ නැහැ'.**

ඔහු මේ ලෝකය තුළ ඔය දේශනාවෙ පෙන්නුම් කළ ආකාරයට

**'හේතුවත්, ඵලයත්, නිරෝධයත්'** ***අවබෝධ කරන්න***

**උනන්දු වෙනවා විනා, ඔහු අන්තයකට යන්නෙ නෑ.**

ඒ පිළිබඳව අවදියෙන්, සිහියෙන් ඉන්න උත්සාහ කරන තැනැත්තා,

***'නිරෝධය' දැකීම නිසාම - ඒ 'මැද යි ඉන්නෙ'.***

තවත් ඒ දේශනා කරපු කොටසක් ගනිමු.

**එක අන්තයක් තමයි <u>අතීතය.</u> අනිත් අන්තය <u>අනාගතය.</u>**

**මැද <u>වර්තමානය.</u>**

අර කළින් සඳහන් කළ විදිහට ම අපි **'මැදුම් පිළිවෙතට'** එනකොට -

**'මේ කොයි කොටසකින් කතා කළත් සමාන වෙන්න ඕනෙ'.**

**අතීතය** කියන එක ගැන අපි බොහෝ විට කරන්නෙ, ධර්මය දන්නෙ නැත්නම් - නිතර මෙනෙහි කරකර සතුටු වෙන එක, නිතර මෙනෙහි කරකර ශෝක වෙන එක, නිතර මෙනෙහි කරකර දුක් වෙන එක.

නමුත් ධර්මයත් සමග වාසය කරන තැනැත්තා භාග්‍යවතුන් වහන්සේ වදාළ දහමට අනුව අවබෝධ කරලා තියෙනවා,

*** මේ අතීතය කියන්නෙ නිරුද්ධ වෙච්ච එකක්.** දේශනාවෙ පෙන්නන්නෙ,

'අතීත ඇස' - අතීතයේදිම නිරුද්ධ වුණාය,

'අතීත රූපය' - අතීතයේදිම නිරුද්ධ වුණාය,

ඇසත් රූපයත් ගැටීමෙන් හටගත්ත යම් විඤ්ඤාණයක් වේ නම් එය ද එහිම නිරුද්ධ වුණාය.

විඤ්ඤාණය කියලා එතන කතා කරන කොට -

**'ස්කන්ධපඤ්චකය ම' ඊට ඇතුළත්.**

**රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියන මේ**

**'පංච ස්කන්ධයෝ ම' අතීතයේ නිරුද්ධ වුණාය.**

එතකොට - **ඒ 'නිරුද්ධ වෙච්ච අතීතය'** - ***නිරුද්ධමයි.***

*** අනාගතය කියන එක නොහටගත්.** ඒ කියන්නෙ,

**තවම 'හේතු ඇතිවෙලා නෑ ඵලය ඇතිවෙන්න'.**

ඒ නිසා අනාගතය නොහටගත් එකක්.

*** වර්තමානය කියන්නේ මේ මොහොත.**

මේ මොහොත සම්බන්ධව බැලුවොත්,

**'මේ මොහොතේ ආශ්වාසය, ආහාරය ප්‍රත්‍යවෙලානෙ'**

මේ ශරීරයේ **ඉන්ද්‍රියන් පහළවෙන්නෙ.**

එතකොට,

- **මේ මොහොතේ ආශ්වාස වාතය ප්‍රත්‍යවෙලා හටගන්න,** මේ මොහොතේ **ප්‍රසාද** - චක්ඛු, සෝත ප්‍රසාද ආදී මේ ආයතන වල රූප ආදී **හේතු පහළ වෙනවා.**

**'ඒ රූප පහළ වෙන හේතු' මේ මොහොතෙම යි.**

- ආලෝකයත් ඒ මොහොතෙම.
- ඉදිරියෙන් මුණගැහෙන රූපය, ශබ්දය ආදී හේතුත් මේ මොහොතෙම එක්ෂණිකව පහළවෙලා නිරුද්ධ වෙනවා.

මේවා අපි තෝරා ගත්තා මුලින්. මේ **ලෝකය කියන එක** නිරන්තරව පහන් දැල්ලක් වගේ, දිය බුබුලක් වගේ කියලා බුදුහාමුදුරුවෝ වදාළා. පෙණ පිඬක් වගේ කියලා පෙණපිණ්ඩූපම සූත්‍රයේ වදාළා.

**ඉතින් මේ රූප සම්බන්ධව තේරුම් ගන්න ඕනෙ-**

**'වහා ඉපිද වහා නැසෙන' ස්වභාවයක්.**

එහෙම තේරුම් ගත්තහම, වර්තමානය කියන එකත් පින්වතුනි,

මේ මොහොත, අතීතය නොවේ, අතීතය නිරුද්ධ වෙලා.

මේ මොහොත අනාගතය නොවේ.

**මේ මොහොතේ මේ 'හේතු ප්‍රත්‍යයෙන්' පහළවෙන 'විඤ්ඤාණය හෙවත් දැනගැනීම',**

**ඒ දැනගැනීමට ලක්වෙන දේ '*ඇත' වශයෙන් පෙනුණත්,***

දේශනාවෙ පෙන්නුම් කරන විදිහට අනිත්‍ය පිළිබඳ යම් වැටහීමක් ඇතුව වාසය කරන කොට, ***'ඇත' වශයෙන් විඤ්ඤාණයට පහළ වුණත්'*** ඔහු දන්නවා -

**ඒ 'ඇත' යන 'විඤ්ඤාණයෙන් දැනගන්න ස්වභාවයට' පත්වෙනකොට යම් 'ප්‍රතිබිම්බයක්' - ඒ 'හේතු නැසිලා'.**

ඇහැ නැසිලා, ගැටුණු ගෝචර රූපය නැසිලා.

ඒ විඤ්ඤාණයෙන් දැනගන්න යම් දෙයක් හෝ වස්තුවක් වශයෙන් **'පිළිගැනීමකට හිත ලක්වෙනවා'.**

***'ලක්වුණත් එයා දන්නවා ඒක හේතූන්ගේම ඵලයක්'.***

හේතු ප්‍රත්‍යයෙන් හටගෙන මේ **'උපාදාන'ස්කන්ධය, මේ 'විඤ්ඤාණය පහළ වෙන්නෙ'.**

**විඤ්ඤාණයත් සමග මේ ස්කන්ධපඤ්චකයක් පහළවෙන්නෙ-**

**'උපාදාන'ස්කන්ධය.**

**මේ උපාදානස්කන්ධය 'වර්තමානයේ හේතුප්‍රත්‍යයෙන්' පහළ වෙනවා,**

**ඒ පහළවෙන ස්කන්ධයෝ එහිම නිරුද්ධවෙලා යනවා.**

මේ බව නුවණින් අවබෝධ කළහම, ඔහුට **වර්තමානය** පිළිබඳ වැටහීමක් ඇතිවෙන්නෙ

අතීතයෙන් ආව හේතු නෙවෙයි,

අනාගතයට අදාළ වූ හේතුවත්, ඵලවත් නෙමෙයි.

මේ **'වර්තමාන හේතු ගැටිලා පහළවෙන'** මේ චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනෝ **විඤ්ඤාණ කියන මේ දැනගැනීම්** -

**හේතු සමග පහළවෙලා එහිම නිරුද්ධ වෙනවා.**

එතකොට එතනත් අපිට

***'ඒ ඵලය, දෙයක් කෙනෙක් වස්තුවක් කොට පිළිගන්න බැහැ'.***

'ගැටෙන ***එක්ෂණයෙහි ම',***

**'වර්තමානයේ ම වර්තමාන නිරෝධයක්'** පෙනෙනවා මිස,

**'ස්කන්ධයන්ගේ' පහළවීමක් නිරෝධයක්** පෙනෙනවා මිස,

අතීතයට යන්න බෑ, අතීතය කියන්නෙ නිරුද්ධ වෙච්ච එකක්. 'ඒ හේතු ගැටිලා නිරුද්ධ වුණේ වර්තමානයේදී ම' නිසා අතීතයට ගියා නොවෙයි.

ඒ වගේම හේතු ගැටිලා පහළවුණ ඒවා එහිම නිරුද්ධ වෙච්ච නිසා වර්තමානයෙම - අනාගතයට ගියා නොවෙයි.

එතකොට එහෙනම් 'මේ මොහොතේ පහළවුණු මේ ස්කන්ධයෝ මේ මොහොතෙහිම නිරුද්ධ වෙලා යනවා'.

ඒ බව **නුවණින් අවබෝධ කළහම** ඔහු

මේ ලෝකය **'ඇත' යැයි ගන්නෙ** නැහැ,

මේ ලෝකය **'නැත' යැයි ගන්නෙ** නැහැ,

**'සත්වයෙක්, පුද්ගලයෙක්, තමන්, අනුන් කියලා ගන්නෙ** නැහැ.

***'ස්කන්ධයන්ගේ පහළවීමකට යි' මේ රැවටෙන්නෙ.***

'මේ මොහොතේ ඉන්ද්‍රියන් ප්‍රත්‍යයෙන් පහළවෙන'

ඒ 'ප්‍රතිබිම්බ වැනි ස්වභාවයකටයි රැවටෙන්නෙ' - චක්ඛු විඤ්ඤාණයට.

මේ චක්ඛු විඤ්ඤාණය කියන තැනදිත් අපි දැනගන්න ඕනෙ,

ඒ චක්ඛු විඤ්ඤාණය හටගන්න දායක වුණ ඇහැ, රූපය ආදී
**හේතු ප්‍රත්‍යයෙන් 'විඤ්ඤාණය හටගන්න මොහොතෙහි ම'**
**-'හේතු නැසිලා',**
**ඒ විඤ්ඤාණයෙන් දැනගන්නෙ ආපහු**
**'ඇහැක් තියෙන බව', 'රූපයක් තියෙන බව'.**

එතකොට ඔය **විඤ්ඤාණය** කිච්චහම පින්වතුනි,
ඔය **ඇහැයි රූපයයි 'ඇති බවට' ගත්ත පිළිගැනිල්ල.**
කනයි, ශබ්දයයි **'ඇති බවට' ගත්ත පිළිගැනිල්ල.**
***-මේ 'විඤ්ඤාණයට අන්තර්ගතයි මේ පිළිගැනිල්ල'-***

එතකොට බලන්න, දැන් කොන් දෙක නුවණින් අවබෝධ කරනකොට අපට එතැනදිත් අර වගේම පැහැදිළි වෙන්න ඕනෙ
**'ඇසක් හෝ රූපයක්' වශයෙන් 'කොටස් කරන්න බෑ',**
**වෙන් කරන්න බෑ.**
**සතරමහාධාතුන්ගේ ස්වභාවයන් නිසා 'මුලු මහත් ඒ දර්ශනයම'.**
ඇහැ වශයෙන් ගත්ත දැකීමත්,
ඇහැට ගැටුණු **දේත්**
ඇහැත්, රූපයත් **මේ දෙකම 'විඤ්ඤාණයමයි'.**

ඒ වගේම ශබ්දයත්, ශබ්දය ඇසුණු කනත් **සෝත විඤ්ඤාණය තුළමයි. ඒ විදිහටම සාන ඉන්ද්‍රියත්, ගඳසුවඳත්, ගඳසුවඳ දැනගන්න හිතත් - මේවා වෙන් කරන්න බෑ.**

මේකයි, *දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති* කියලා භාග්‍යවතුන්වහන්සේ **දාරුචීරිය** අරහයා දේශනා කළ වහාම ප්‍රත්‍යක්ෂ ඥානය ඇති වුණේ. **....වෙන් කළ නොහැකි ස්වභාවය....**
**මේ 'ඇහැයි රූපයි දෙක එකිනෙකට 'වෙන්කරන්නේ'**
**ඒ විඤ්ඤාණයම යි'.**
**'විඤ්ඤාණයේ ස්වභාවයම යි' ඒක.**

නමුත් 'නුවණින්' අවබෝධ කළ තැනැත්තාට මේ **අන්ත දෙක තේරුම් ගත්තහම ඔහුට මේ වර්තමානය පිළිබඳ වැටහීම ඇතිවෙනවා.**

මේ මොහොතේ හටගත්ත, මේ හේතුප්‍රත්‍යයෙන් පහළවුණු විඤ්ඤාණය -

- **ඇත වශයෙන් ගන්නට බැහැ යමක්, ඇයි, හේතු නිරෝධයෙන් නිරුද්ධ වන නිසා.**
- **නැත වශයෙන් ගන්නට බැහැ යමක්, ඇයි, හේතුප්‍රත්‍යයෙන් පහළවෙන නිසා.**

එහෙනම් මේ විදිහට පින්වතුනි

**මේ 'අන්ත දෙක නුවණින් අවබෝධ කළහම'**

**'වර්තමානයේ ඇලෙන්න බැහැ'.**

අර මුලින් සඳහන් කළ ආකාරයටම 'මැද' ප්‍රඥාවෙන් අවබෝධ කළ තැනැත්තාට -

**මේ 'ස්කන්ධ ලෝකයක්' ඇතිවෙලා නැතිවෙලා යනවා මිස, 'සත්ව පුද්ගල ආත්ම වශයෙන් ගන්න බැහැ' මේ 'උපාදාන'ස්කන්ධ ස්වභාවය.**

**ඒවායේ 'නිරෝධය යි' එතැන දකින්නෙ.**

'නිරෝධය' දකිනවා නම් -

**ඒ 'උපාදානස්කන්ධ අරභයා වින්දන වලට ගිහිල්ලා'**

**උපාදාන, භව ආදී වශයෙන් කර්ම රැස්කරන**

**වැඩපිළිවෙලට යැවෙන්නෙ නෑ.**

ඒ වගේම පින්වතුනි, තවත් භික්ෂූන් වහන්සේනමක් මතක් කළා -

**එක් අන්තයක් තමයි <u>රූපය</u>, අනෙක් අන්තය තමයි <u>නාමය,</u>**

**මැද <u>විඤ්ඤාණය.</u>**

මුලින් කිව්ව ධර්ම කරුණු වලින් දැන් මේ කාරණයත් ඉතාම පැහැදිලි වෙනවා.

රූපය පිළිබඳව සතරමහාධාතු වශයෙන් අපි සලකන්නෙ මේ ඇහැට ගැටෙන ලෝකය. අපි හිතමු ඇහැට ගැටෙනවා අපි ඉදිරියෙන් ඇති ගසක් කියලා.

'මේ ඇහැ ඉදිරියෙන් ඇති ඒ ගස' වශයෙන් ගත්ත අවස්ථාව **ධාතු** වශයෙන් මෙනෙහි කරනකොට ඔහු දකිනවා එහි

ඇත්තේ පඨවි ආපෝ තේජෝ වායෝ කියලා - ධාතු.

**ධාතු වශයෙන් මෙනෙහි කරනකොට ඔහුට 'ගස' යැයි යමක් දකින්න බැහැ,**

**එහි ඇත්තේ 'ධාතුන්ගේ ක්‍රියාවක්' කියලා දකිනවා.**

නමුත් මේ ඇහැ ප්‍රත්‍යවෙලා අපට එනවා 'ගස කියන සංඥාව'. ආලෝකය ආදිය ගැටෙනකොට ඇහැට ඒ ප්‍රතිබිම්බයක් පහළවෙලා, ඒ **ප්‍රතිබිම්බය** වශයෙන් අපි සලකනවා ගහ නිසා හටගත්ත ඒ **විඤ්ඤාණය.**

එතකොට ඒ විඤ්ඤාණයෙන් දැනගන්න ගහේ ස්වභාවයට යටින් අපි දන්නවා මේක හැදිලා තියෙන්නෙ සතරමහාධාතුන්ගෙන් බව. නමුත් අපි -

**'සතරමහාධාතුමයි' කියලා තෝරාගත්ත තැනදි 'රූපය අන්තයට' ගියා වෙනවා.**

ඒ වගේම මේක **'නාමස්කන්ධයක් පමණයි' කියලා, 'සංඥාවක් පමණයි' කියලා ගත්තොත් ඒක නාමය අන්තයට ගියා වෙනවා.** රූපය අතහැරලා අපි සිත පැත්තට හැරෙනවා.

සතරමහාධාතු වශයෙන් ගත්තොත් 'වෙන කිසිවක් නැහැ' කියලා ඒක රූපය අන්තයට යනවා. 'සතරමහාධාතුන්ගේ ප්‍රත්‍යයෙන් හටගත්ත මේ සංඥාවක් විඤ්ඤාණයෙන් දැනගන්නෙ' කියලා ඒ අන්තයට ගියොත් අපි නාමය අන්තයට යනවා.

නමුත් නුවණින් යුක්තව සලකන තැනැත්තා -

මේ **හේතුප්‍රත්‍යයෙන් හටගන්න විඤ්ඤාණයකුයි- 'උපාදානස්කන්ධය යි' මේ පහළවෙන්නෙ.**

**'රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ' කියන ස්කන්ධයෝ යි** මේ පහළවෙන්නෙ.

ඒ **ස්කන්ධයෝ** අපට -

රූප වශයෙන් **අන්තයකට යන්නත් බෑ,**

**නාම** වශයෙන් **අන්තයකට යන්නත් බෑ,**

**හේතුන්ගේ ප්‍රත්‍යයෙන් පහළ වෙනවා,**

**හේතු නිරෝධයෙන් නිරුද්ධවෙලා යනවා.**

මෙන්න මේ විදිහට පින්වතුනි එතකොට අපි - **අන්ත දෙකට ගියේ නෑ.**

නමුත් ඒ අන්ත දෙකට ගියා නම් රූපය හෝ නාමය, ඒ අය තමයි බෝසතාණන්වහන්සේ ගුරුවරයින් වශයෙන් ඇසුරු කළ ආලාරකාලාම ආදී අය. රූප ධ්‍යාන, නාම ධ්‍යාන වල රැඳිලා හිටියෙ ඒ වගේ අන්ත වලට ගිය නිසා.

නමුත් **නුවණින් මේ අන්ත දෙක අවබෝධ කළහම** ඔහු දකිනවා -
**මේ 'විඤ්ඤාණය යි' ආපහු 'රූපය යි කියලා ගන්නෙත්',**
**විඤ්ඤාණය යි මේ නාම කොට ගන්නෙත්,**
**'විඤ්ඤාණය' කිව්වෙ 'හේතූන්ගේ ඵලයක්'.**
ඒ, හේතු ගැටිලා පහළවෙන චක්ඛු විඤ්ඤාණ ආදී හේතූන්ගේ ඵලයක්.
***ඒ විඤ්ඤාණය, ඇත හෝ නැත කියලා ගන්න 'කාලයක් නැහැ',***
***'හේතුප්‍රත්‍යයෙන් හටගත්තා, එහි ම නිරෝධයට පත්වුණා'.***

මෙන්න මේ විදිහට පින්වතුනි, එහිත් අපට වැටහෙනවා
*'අන්තයකට නොයා ඒ අවබෝධයෙන්' මැදුම් පිළිවෙතේ හැසිරෙන්නට හැකි බව.*
එවිට අර **තණ්හාවට එකතුවෙන්නේ** නැහැ.
**සිබ්බනිය කියන** ඒ මැහුම්කාරියට එකතුවෙන්නෙ නැහැ.

ඒ වගේම ඒ සූත්‍රයේ පෙන්නනවා තවත් අන්තයක්,
**එක් අන්තයක්** <u>සැප වේදනාව,</u> **අනිත් අන්තය** <u>දුක් වේදනාව</u>,
මැද වශයෙන් පෙන්නන්නෙ **<u>අදුක්ඛමසුඛ වේදනාව</u>** හෙවත් **උපේක්ෂා වේදනාව.**

එහිදී තේරුම් ගන්න උත්සාහ ගන්න බලන්න,
නිරන්තරව මේ සත්වයෝ **සැප වේදනාවක් ආවහම** - **සැප වේදනාව 'තියෙන දෙයක්' කොට එහි අන්තයට යනවා.**
ඒ වගේම **දුක් වේදනාවක් ආවහම** - **'දුක් වේදනාවත් තියෙන**

**දෙයක්' සේ සලකලා එහි අන්තයට යනවා.**

නමුත් යථාර්ථය බලන්න, මේ සැප වේදනාවක් එන අවස්ථාවේ සැප වේදනාවට අදාළ හේතු ස්පර්ශ වෙලා ප්‍රිය වූ රූපයක් වේවා, ශබ්දයක් වේවා, ගන්ධයක් වේවා, රසයක් වේවා, ..

මේ ආයතනයන්ට ස්පර්ශවෙලා, ඒ **'ස්පර්ශය හේතුවෙන් විඳීමක්'** ඇතිවෙනවා.

**ඇසේ අනිත්‍ය වීම නිසා, රූපයේ අනිත්‍ය වීම නිසා, හටගත්ත චක්ඛු විඤ්ඤාණයේ වෙනස් වීම නිසා,**

**ඒ ස්පර්ශයත් එහිම නිරුද්ධ වෙනවා,** ඒ ඇස පිළිබඳ හටගත්ත *චක්ඛු සම්ඵස්සය.*

- ***නිරුද්ධ වීමත් එක්කම අර 'විඳීමකට ඉඩක් නැහැ'.***
- **ඒ විඳීම එහිම නිරුද්ධ වන නිසා *'තණ්හාවකට ඉඩක් නෑ'.***

ඒ වගේම, දුක් වේදනාවකට හේතුවක් යෙදුණොත් - ඇහැට අප්‍රිය අමනාප වූ රූප ගැටෙනවා, කනට අප්‍රිය අමනාප වූ ශබ්ද ගැටෙනවා, දිවට අප්‍රිය අමනාප වූ රස ගැටෙනවා, නාසයට අප්‍රිය අමනාප වූ ගන්ධ ගැටෙනවා, කයට අප්‍රිය අමනාප වූ ස්පර්ශ ගැටෙනවා, ඒ වගේම මනසට අප්‍රිය අමනාප වූ අරමුණු එනවා. මේ හේතු ගැටිලයි, ස්පර්ශ වෙලයි දුක් වේදනාවක් පහළ වෙන්නෙ.

**ඒ 'දුක් වේදනාව පහළ වෙන්න ගැටුණු ස්පර්ශ හේතු',** ඒ මොහොතේ හටගත්ත ස්පර්ශය හේතුවෙන් **ඒ මොහොතේම නිරුද්ධ වෙනවා - 'ඉතුරු නැතුවම'.**

**'කලින් නොතිබී' ඒ මොහොතේම හටගත්ත හේතු ගැටීමෙන් ස්පර්ශය නිසා විඳීමක් ඇතිවෙනවා,**

**ඒ විඳීම එහිම 'හේතු නිරෝධයෙන්' නිරුද්ධ වෙලා යනවා.**

එතකොට බලන්න දුක් වේදනාවට හේතු නිසා දුක් වේදනාව පහළ වෙලා හේතු නැසීමෙන් නිරුද්ධ වෙලා ගියා. සැප වේදනාවට අදාළ හේතු මුණගැහිලා ස්පර්ශයෙන් සුඛ වේදනාව ඇති වුණා, ඒ සුඛ වේදනාවත් හේතු නිරෝධයෙන් නිරුද්ධ වුණා.

නමුත් බොහෝවිට මේ පුහුදුන් ලෝකය ගන්නෙ '**නිරෝධය**' **පිළිබඳ** **නෙමෙයි**, සැප වේදනාවක් ආවහම ඒක '**හැමදාම තියෙන දෙයක්' කොට සලකනවා. දුක්** වේදනාවක් ආවහම ඒකෙත් අන්තයට යනවා, **හැමදාම තියෙන දෙයක්** සේ සලකනවා. ඒ නිසයි,

- **සැප වේදනාවෙ ඇලීම ඇතිවෙන්නෙ, රාගයට හේතුවක් වෙන්නෙ,**
- **දුක් වේදනාවෙ ගැටීම ඇතිවෙලා ද්වේෂයට හේතුවක් වෙන්නෙ.**

නමුත් යථාර්ථය අවබෝධ කළා නම් මේ **ස්පර්ශ නිරෝධය**,

සැප වේදනාවත් එකෙනෙහිම නිරුද්ධ වෙලා යනවා - *ඵස්ස පච්චයා වෙදනා.*

ඒ වගේම දුක් වේදනාවට අදාළ ස්පර්ශය එහිම නිරුද්ධ වෙනවා, හේතු නිරෝධයෙන්. දුක් වේදනාවට එතැන පවතින්න බෑ, එහිම නිරුද්ධවෙලා යනවා.

ඒ නිසා මැද ඇත්තේ,

**අදුක්ඛමසුඛ හෙවත් උපේක්ඛාව** - ***අන්තයකට නොයෑම.***

එතකොට මෙන්න මේ උපේක්ඛාව කියන එක කෙනෙක් හිතන්න පුළුවන් "අපි සැප දුක් දෙකට යන්නෙ නැතුව මැද උපේක්ෂාවෙ හිටියොත් හරි නේද" කියලා. ***එහෙම වෙන්නෙ නෑ*** පින්වතුනි.

**මේක මැදුම් පිළිවෙතක් වෙන්නෙ** තථාගතයන්වහන්සේ වදාළ,

'***හේතුවත් ඵලයත් එහි නිරෝධයත්***' *දැකීමෙන්.*

*'සැප වේදනාවට අදාළ* ***හේතුවත් ඵලයත් එහි නිරෝධයත්'***
***දකින කොට 'සැප වේදනාව පිළිබඳ උපාදානයකට යන්න බැහැ'.***

දුක් වේදනාව ද හේතු ප්‍රත්‍යයෙන් හටගත්තෙ ඒ මොහොතෙ, **කලින් නොතිබී.** ඒ දුක් වේදනාවට අදාළ හේතු ස්පර්ශ වෙලා *ඵස්ස පච්චයා වෙදනා* ආදී විදීම් වලට යන කොට, ඒ හේතු නිරෝධයෙන් අර දුක් වේදනාවත් එහිම නිරුද්ධ වෙනවා.

**ඉතින් මේ *'හේතු සම්බන්ධව නොදැක',***
**ඵලය විතරක් 'ඇති දෙයක් සේ සලකලා' තමයි**
**කෙනෙකු මේ 'මැද අතහැරලා අර සසරට යන්නෙ',**
**'අන්ත වලට යන්නෙ'.**

ඒ වගේම, තවත් භික්ෂූන් වහන්සේනමක් මතක් කළා - **සක්කාය** එක් අන්තයක්, **සක්කාය සමුදය** දෙවෙනි අන්තය, **සක්කාය නිරෝධය** මැදයි. යම් කෙනෙක් මේ අවබෝධය ලැබුවොත් ඔහුට භාග්‍යවතුන්වහන්සේ වදාරනවා 'මහාපුරුෂයාය' කියලා. ඔහු සිබ්බනිය නම් මැහුම්කාරියගෙන් හෙවත් ඒ තණ්හාවෙන් සසර නැවත ගැටගැහෙන්නේ නැහැ.

**සක්කාය** කියන්නෙ පින්වතුනි **පංච'උපාදාන'ස්කන්ධයේ හටගැනීම.**

ඒ කියන්නෙ - **'මම ය මාගේ ය කොට බැසගැනීම' යි.**

**සක්කාය සමුදය** කියන්නෙ **ඒ සක්කාය දිට්ඨිය** ඇතිවීමට **හේතුන්.**

**'සක්කාය දිට්ඨිය'** ඇතිවෙන්නෙ රූප, **වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ** කියන **'ස්කන්ධ පඤ්චකය' මුල්කරගෙනයි.**

- **ඒ, 'ස්කන්ධ ලෝකයේ යථාභූතය' නොදන්නා නිසා - 'තමන්, අනුන්, පුද්ගල, දේවල්, වස්තු'** වශයෙන් **'කොටස් වෙනවා'.** ව්‍යවහාර වෙනවා. නම් කරනවා.
- ඒ නිසා, **'ස්කන්ධ'** කියන තත්වය **පැහැදිලිව ම හෙළිවෙන්න ඕනෙ.**

අර **නමක් දීමෙන්** අපට යමක් **'සංඥා කරන්න'** සිද්ධවුණු බව පෙනෙනවා.

- **සංඥාවෙහි විපාකය ව්‍යවහාරයයි.**
  මේ ව්‍යවහාරයට අපි ආවෙ සංඥා කරලයි.
- මේ **'සංඥාව' පිළිබඳ විඳීම්** ඇතිවෙනවා - **මනාප, අප්‍රිය.**
- **ඒ විඳීම් සමග සංඛාර** ඇතිවෙනවා - ලෝභ, ද්වේශ, මෝහ, අලෝභ, අද්වේශ අමෝහ.

- **'ඒ අනුව විඤ්ඤාණය ඒ බව දැනගන්නවා'.**
- **සංඥා කරන්න වෙන්නෙ 'ඇති බව, ස්ථිරව පවතින බව' පිළිගැනීමෙන්.**
- **'විඤ්ඤාණයේ ස්වභාවය' තමයි, 'සංඥාවෙන් යමක්ද හඳුන්වා දෙන්නේ, එය දැනගන්න එක'.**
- අනුකරණයෙන්, 'අනුන්ගේ දැනීමත් එක්ක' තමයි අපි ලෝකය හඳුනාගත්තේ.
- **ඒ වෙන්කර හඳුනාගන්න කොට, ඒ 'දේවල් නැවත සිහිවෙන්න කාරණා' බවට පත්වුණා.**

මේ ඇහැ ප්‍රත්‍යයෙන්, ඇහැට ගැටෙන වර්ණසටහන ප්‍රත්‍යයෙන් චක්ඛු විඤ්ඤාණය පහළවෙනවා. ඒ **'චක්ඛු විඤ්ඤාණය යමෙක් නොවෙයි', හේතූන්ගේ සකස් වීමක්.**

නමුත් **එය වහා 'යමෙක්** වෙනවා'. යමෙක් වෙනවා කිව්වට එහෙම 'වෙනවා' නෙමෙයි - **'වෙන්න ඉඩ දීලා'.**

අපි **යෝනිසෝමනසිකාරය යොදනවා නම් 'යමෙක් නොවන තැනට' - 'හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්න ඵලයක්' බවට තැන දෙන්න ඕනෙ. එතැන මෙනෙහි කරන්න ඕනෙ**

**මේ අවබෝධය තුළ ස්ථාවර වෙන්න.**

එතකොට - 'අන්තයක් නැති අර වර්තමානය' ගැන එයාට හෙළිදරව්වක් එනවා. 'අන්ත තුළ වෙහෙසයි, **අන්ත තුළ තණ්හාව ඇතිවෙනවා'. අන්තයට යන්න බෑ 'මැද විඤ්ඤාණය' හෙළි වුණොත්.** මේ මොහොතේ හේතූන්ගෙන් සකස්වෙලා පහළවෙන විඤ්ඤාණ ධාතුව යමෙක් නොවෙයි.

**එතැනයි විශේෂ - 'යමෙක් නොවෙයි',**

**'හේතුප්‍රත්‍යයන්ගේ හටගැනීමක්'.**

යමෙක් වෙන්නෙ කොහොමද චක්ඛු ඉන්ද්‍රියේ ක්‍රියාකාරිත්වය, ශ්‍රවන කෘත්‍යය. යමෙකුට ඇහෙනවා නොවෙයි - ඒ 'ශ්‍රවන කෘත්‍යය'.

**'යමෙක්'වෙන්නෙ - කර්මයේ ප්‍රත්‍යයෙන්,**

**අවිද්‍යා ප්‍රත්‍යයෙන්.**

එහෙම වෙන්නෙ නෑ,

**'සතරමහාධාතූන්ගේ යථාභූතය' හෙළිවෙන ප්‍රමාණයේ හැටියට ඕතැන හෙළිවෙනවා.**

**මේ** - වර්තමාන හේතූන්ගෙන් සකස්වී නිරුද්ධවන

**හේතුඵල න්‍යායක්, ධර්මතාවයක්.**

**ඒ තුළ උපාදානයට ඉඩ නෑ.**

**ලෝකය උපාදාන නොකරගෙන අත්හරින්න පුළුවන්.**

**අත්හරිනවා කියලා මොකක්ද අත්හරින්නෙ?** -

***'අවිද්‍යාව, තෘෂ්ණාව, කර්මය අතහැරෙන්නෙ'.***

විඤ්ඤාණය 'පැහැදිළි වතුරකට වැටෙන හෙවනැල්ල' වගේ. පැහැදිළි වතුරෙ හෙවනැල්ල පෙනුණට, අපි දන්නවා 'දේවල් නොවෙයි'. නමුත්, වහා 'දේවල්' **බවට පත්වෙන්නෙ අවිද්‍යා ප්‍රත්‍යයෙන්, කර්ම ප්‍රත්‍යයෙන්, තෘෂ්ණා ප්‍රත්‍යයෙන්, ආහාර ප්‍රත්‍යයෙන් ....**

- **කර්ම** කියන්නෙ - **'පෙර දේවල් කරගත්ත' හේතුව, යළිත් 'දේවල් ' කරගන්න ඉදිරිපත් වෙනවා.**
- **තෘෂ්ණාව** කියන්නෙ - **'ඒ දේවල්' පරිහරණයට තියෙන කැමැත්ත.**

ඇයි - **'දේවල්'ම පරිහරණය කරලා** තමයි **'තණ්හා උපාදාන වෙච්ච ගති'** මනසේ අඩංගුවෙලා' තියෙන්නෙ.

**'නැවත හේතු' බවට පත්වෙන්නෙ** - **ඒවා.**

නමුත් ඒ **'විද්‍යමානවෙන** විඤ්ඤාණය' - 'වර්මාන' හේතූන්ගේ සකස්වීමක්. එතෙන්ට **තණ්හාවට යන්න පුළුවන්ද?**

**'ඒ හෙළිදරව්ව තුළ' යම් සිහියක් ඇත්නම් තණ්හාවට ඉඩ** නෑ. 'දේවල් බවට' එතැන පත්වෙන්න බෑ.

**එතකොට, සිබ්බනිය නම් මැහුම්කාරියට මහන්න බෑ.**

- **අවිද්‍යාව** කියන්නෙ - **ඒ විදිහට 'යථාභූත වශයෙන් නොදැක්ක බව'.**
- **ආහාර ප්‍රත්‍යය** - ආශ්වාස වාතයෙන් කබලිංකාරාහාරය දැවී

ඇතිවන 'ශක්තිය' **ඉදිරිපත් වෙනවා 'සිහිවෙන්න'.**

**'විඤ්ඤාණයේ පහළවීමක්'** කියලා දකින්න ඕනෙ,

'කෙනා' නොවෙන්න ඕනෙ.

**'ස්කන්ධ පහක' පහළවීමක් නෙ.**

**ඉන් එහාට, පුද්ගල, වස්තු කතාවක් නෑ ඔතන.**

හේතු සමග ම පහළවී, හේතු නිරෝධයෙන් නිරුද්ධ වන ස්වභාවයක්. **'අන්තයක් නෑ' එතන.**

නමුත් 'වහා' **දේවල් බවට පෙරලුණොත්, සිබ්බනිය නම් මැහුම්කාරියට කොටු වෙනවා.** මැහුම්කාරිය අන්ත දෙක එකතු කරනවා. ඒ කියන්නෙ **'භවයට කර්ම සකස් කරනවා'.**

දැන් - 'සිද්ධි' වශයෙන් නිරුද්ධ වුණාට, 'කර්ම නිරුද්ධ වෙලා නෑනෙ. 'නිරුද්ධයි' කියන වචනෙට අයිති -

**'විදර්ශනා නුවණකින්ම' වෙන්න ඕනෙනෙ කර්ම ක්ෂය වීම.**

සිද්ධිය නිරුද්ධ වුණාට,

**'ඉතුරු නැතුව' නිරුද්ධ වූ බවට**

**'විදර්ශනා ප්‍රඥාවකින්' හෙළිවෙලා නෑනෙ.**

සිද්ධි නිරුද්ධවීම නම් නිරන්තරව වෙනවා.

**මෙතන 'විදර්ශනා නුවණ' යෙදුණොත් තමයි 'හේතු සමගම ඵල නිරුද්ධ වුණා' කියලා 'දැක්මක්' එන්නෙ.**

එතකොට එතන **'සත්වපුද්ගල සංඥාවක' ජීවත්වෙනවා නෙමෙයි,**

**'ස්කන්ධ'** බවට හෙළිදරව්වීමක් තියෙන්නෙ.

**සිබ්බනිය නම්** මැහුම්කාරිය **'ඉක්මවා ගිය' ඒ** සිද්ධිය භාග්‍යවතුන්වහන්සේ වදාළේ - ඔහුට 'මහා පුරුෂයෙක්' යැයි කියමි.

ජාතියක් වශයෙන් ඉපදුණේ පෙර ජීවිතයේ කර්ම ප්‍රත්‍යවීමෙන්. 'පෙර ඇසුරුකළ මානසික හේතුවල', ඒ අතීත කර්මවල ඵලයක් ලෙසයි ඇහැ, කන, නාසය ... පහළවෙන්නෙ. ආයතන ලැබුණෙ.

**දැන් ආයතන පහළවෙනකොට ම අර 'ඇති බවට දෘෂ්ටිය' පහළවීම 'ස්වභාවිකවම' වෙනවා -**

මේ **'පෙනෙන දේවල් තියෙනවා'** කියලා.

ඔය 'පෙනෙන බවක්' මිස 'තියෙන දේවල්' ද? අපට 'යථාභූත ඥානයක්' තියෙන්න ඕනෙ, පෙනෙන 'දේවල්' නොවෙයි -

**මේ 'පෙනෙන ස්වභාවයක් '**

මේ මොහොතේ ඇසත්, මේ මොහොතේ වර්ණ සටහනත් - 'මේ මොහොතේ ම' හේතූන්ගෙන් සකස් වෙනකොට,

පහළවෙන 'දර්ශනයක්', **විද්‍යමාන වීමක්** - **විඤ්ඤාණය.**

ඒක - විද්‍යාමාන වීමක්.

ඇයි ඒවා අපට 'වස්තු කරගන්න බැරි'?

'වස්තු' කියනකොට, '**වස්තු වලට' අතීතයක් තිබුණා, වර්තමානයක් තියෙනවා, අනාගතෙත් තියෙනවා.**

නමුත්, **'ධාතූන්ගේ ක්‍රියාකාරීත්වය' අවබෝධ කළ කෙනෙකුට ඒක පිළිගන්න පුළුවන්ද?**

**සතරමහාධාතූන්ගේ යථාභූත තත්වය, එක්ෂණික අනිත්‍ය, විපරිනාමී** බව හෙළිවුණ කෙනෙකුට - 'කලින් තිබුණු දේවල්' හම්බවෙයිද? එතැනින් ගියාට පස්සෙ ඒවා එතැන තියෙනවද?

නෑ, 'ඒක වස්තු සංකල්පයට' අයිති එකක්.

මේ ලෝකෙ - 'පුද්ගල, වස්තු, දේවල් කියලා පිළිගන්නා මතයට' අයිති දෘෂ්ටියක්, ව්‍යවහාරයක්.

යථාභූත තත්වය හෙළිවෙනකොට වැටහෙන්න ඕනෑ,

**'පෙර නොතිබීම' හටගන්න** - **'හේතූන්ගේ ප්‍රත්‍යවීම්'.**

**අකාලිකයි, කාලයක් දෙන්න බෑ.**

කාලයක් දුන්නොත් ප්‍රපංචයන්ට ඉඩ ලැබෙනවා.

**'කාලය' කියන්නෙ** - **'ප්‍රපංච යි'.**

'හේතුප්‍රත්‍යයෙන්' හටගන්න තැනම නිරුද්ධ වෙන හෙළිදරව්වක් එනකොට - එතෙන්ට කාලයක් දෙන්න බෑ.

**කාලයක් දුන්න ගමන් ප්‍රපංචයට ගිහින්** 'සත්ව, පුද්ගල, දේවල්, වස්තු බවට' **පත්වෙනවා.**

**ඒ තමයි** - **'උපාදාන'ස්කන්ධ.**

එතකොට - අපට වෙහෙස දැවිලි නැතුව ඉන්න නම්, අපි මේක සාක්ෂාත් කරන්න ම ඕනෙ. මේ 'දැක්මට' අපි පත්වෙන්න ම

ඕනෙ. අපට වෙහෙස දැවිලි නිරන්තරව තියෙන්නෙ ඔය **'අන්ත දෙකේ'**. මේ අන්ත දෙකට ජීවිත කාලය ගෙවා දමනවද කියලා හිතලා බලන්න.

මෙච්චර කාලයක් සංසාරෙම ගෙවුණෙ අන්තවල. තවත් අන්තවලම ගෙවිල යයි. ඒකට යි සම්මාදිට්ඨියක් ඕනෙ.

**ඒ 'සම්මාදිට්ඨිය හෙවත් මැද, වර්තමානය කියන යථා තත්වය' හෙළිදරව්වීම තුළ 'කර්මක්ෂය වෙනවා'.**

අතීත කර්ම ක්ෂයවෙනවා, අනාගතයට කර්ම සකස්වෙන්නෙ නෑ. වර්තමානය පිළිබඳ විනිවිද දැකීමක් ඇතිවෙන කොට, අතීත කර්ම අතහැරෙනවා. ඇයි, **'සත්ව පුද්ගල ආත්ම දේවල්, වස්තු නොවෙයි පරිහරණය කළේ'** කියලා දකිනවා.

**'දෘෂ්ටියක්' පරිහරණය කළේ** කියලා දකිනවා.

ඒ **'දෘෂ්ටිය තුළ යි'** - පුද්ගලයො ඉන්නෙ, දේවල් තියෙන්නෙ, මරණය තියෙන්නෙ, මැරෙන අය ඉන්නෙ

- ***සක්කාය දෘෂ්ටිය.***

'ජාති ජරා ව්‍යාධි ශෝක මරණ ඉක්ම වූ **යථාභූත දර්ශනය**' යි බුදුරජාණන්වහන්සේ වදාළේ. අපට මේ **'සත්ව පුද්ගල ආත්ම සංකල්පය' සම්පූර්ණ අතීත අන්තයක්.**

- ***'අතීතයේදි පරිහරණය කළ දෘෂ්ටිය' ,***
- ***'හේතු ගැටෙන විට',***
- ***'නැවත අලුතෙන් සංස්කරණය වීමක්'.***

නමුත් අතීතය 'සම්පූර්ණයෙන් ම' වැළලුණු පැත්තක්. ඒකටම අදාළයි අනාගත අන්තය, ඊට අනුව කරන්න, කියන්න, හිතන එක.

වතුරකට වැටෙන හෙවනැලි වැනි - 'වර්තමාන හේතුප්‍රත්‍යයෙන් පහළවන' **විඤ්ඤාණයට 'ආත්මයක්, පැවැත්මක් දෙන්න බෑ'.** 'වර්තමාන හේතු' නිසා හටගන්න ඵල 'ඉතිරි නැතිව නැතිවීම' ගැන හෙළිවීම තුළ - **ඒ නිරුද්ධවීම අපි සිහි කරන්න ඕනෙ** -

**'ඒවා අතීතයට ගියා නොවන බව'** දැකලා.

**අනාගතයේ හමුවෙනවා කියලා එකක් නැතිවෙන්න ඕනෙ.**

මේ සූත්‍රයේ පෙන්නන **තණ්හා නමැති සිබ්බනිය ඉක්මවා යන්න පුළුවන් වුණේ** -

**විඤ්ඤාණය, 'මම' නොවන නිසා,**
**විඤ්ඤාණය, 'දේවල්' නොවන නිසා.**

**මේ 'ස්කන්ධයෝ හේතූන්ටම අනුව ප්‍රත්‍යවෙනවා, නිරුද්ධ වෙනවා'** කියන **'අවබෝධය'** ලබන්න ලබන්න,

- **'සක්කාය දිට්ඨියේ බැඳුණු සිත' නිදහස් වෙනවා.**
- **'මම' යන්නක් පිළිගන්නට** බැරි බවට ප්‍රත්‍යක්ෂ වෙනවා.
- **'මම, මගේ'** යන්න **ව්‍යවහාර මාත්‍රයක් මිස, 'දැඩිව ගන්නට හේතු වූ අවිද්‍යාව'** පහවෙනවා.

මේ සඳහා පූර්ණ කැපකිරීමක් අපට අවශ්‍යයි.
හේතුව - ඒ තථාගත බුද්ධ දේශනාව ශ්‍රවණය කරන්න, ඒ පිළිබඳ සිහිය පිහිටවාගන්න ලැබුණු මේ උතුම් අවස්ථාව පැහැර හරිනවා කියන එක මහා අවාසනාවක්. ඇයි, මේ අවස්ථාව නැවත ලැබෙයි කියන්න බෑ. ලැබුණු අවස්ථාව ඉතාම දුර්ලභයි.

ඉතින් ඒ නිසා මේ ඥානවන්ත පින්වතුන් කල්පනා කරන්න ඕනෙ, මේ **මජෙඣ සූත්‍රය ඉතාම වටිනා සූත්‍රයක්.** මේ සූත්‍ර දේශනාවේ ඇතුළත් වූ කරුණු සාරාංශ වශයෙන් මේ අවස්ථාවෙ පැහැදිළි කිරීමක් කළේ.

මේවා ආර්යයන්වහන්සේලා එකතුවෙලා එදා සාකච්ඡා කරලා කොච්චර ජීවිතයේ අර්ථයක් කරගත්තද බලන්න.

මනුස්ස ජීවිතයක් ලැබූ අපි තථාගත බුදුරජාණන්වහන්සේගේ 'මේ උතුම් සත්‍ය ධර්ම කරුණු' සාකච්ඡා කරන්න ඕනෙ. **'මෙහි ඇතුළත් මැදුම් පිළිවෙතේ ද' අපි ඉන්නෙ කියලා හිතන්න ඕනෙ.**

අපි 'අන්තවල' නොවෙයිද ඉන්නෙ?

දහම දන්නෙ නැත්නම් අපි ඉන්නෙ අන්තවල. **අපි භාග්‍යවතුන්වහන්සේ දෙසූ මැදුම් පිළිවෙතේ ගමන් කරනවා**

**කියලා හිතුවට, අපි ඉන්නෙ 'අන්තවල'.**

ඉතින් ඒ නිසා යම් කෙනෙක් මේ ධර්ම මාර්ගය අවබෝධ **කරගත්තොත් මේ ජීවිතයේදී ඔහුට *'මේ මැදුම් පිළිවෙත'* මුණගැහෙනවා.** මැදුම් පිළිවෙත මුණගැහුණොත් ඔහු තුළ ඇති සියලුම දුක්දොම්නස් පහවෙලා **මේ සසර අත්හරින්න** තරම් - එහි අවසානයේ පෙන්නන්නෙ - ඒ ආර්යයන්වහන්සේලාට හැකිවෙන බවයි.

ඒ දේශනාවේ අවසානයේ පෙන්නුවා තථාගතයන්වහන්සේ, "යම් භික්ෂුවක් **අභිඤ්ඤා වශයෙන් විශිෂ්ඨ ඥානයෙන් දතයුතු මේ කරුණු අභිඤ්ඤා වශයෙන් දැනගෙන, පරිඤ්ඤා වශයෙන් පිරිසිඳ දැනගෙන, මේ ජීවිතයේදීම දුක් කෙළවර කරන්නට සුදුසු වෙනවා" කියලා.**

ඉතින් ඒ නිසා මේ පින්වතුන් කල්පනා කරන්න ඕනෙ, අප මේ දේශනා කරන්න උත්සාහ කළ ධර්ම කරුණු ඔස්සේ තථාගතයන්වහන්සේ වදාළ 'උතුම් මැදුම් පිළිවෙත' සාක්ෂාත් කරගන්න ඉතාම පහසුවන විදිහට මේ ධර්ම කරුණු තේරුම් කරගන්න උනන්දු වෙන්න ඕනෙ. උනන්දු වෙලා මේ ජීවිතයේදීම මේ උතුම් සම්මාදිට්ඨි නුවණ ඇතිකරගෙන සංසාර දුකින් මිදී ලබන අජරාමර අමාමහ නිර්වාණ සම්පත්තිය සාක්ෂාත් කරගන්නට හේතුවාසනා වේවා කියලා ප්‍රාර්ථනා කරගන්න.

සම්මා සම්බුදු සරණයි !

*කෑගල්ල, බෙලිගල, මැටියගනේ, ශ්‍රී බුද්ධරක්ඛිත ආශ්‍රමාධිපති පූජනීය ගලතර ධම්මරක්ඛිතතිස්ස ස්වාමීන්වහන්සේ විසින් 2013.10.29 දින ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ පැවැත්වූ සදහම් දේශනාව ඇසුරෙනි...*

## *පුණ්‍යානුමෝදනාව*

පරලොව සැපත් අපගේ මෑණියන් වන,

**පොඩිනෝනා වෙත්තසිංහ** මාතාවට සහ

සුජීවත්ව සිටින

**පියාණන්ට**

*පින් පිණිස*

මෙම ධර්මදානමය කුසලය හේතු වාසනා වේවා!

නන්දා දිසානායක,

ආර්. චන්ද්‍රසේන.

- බුලත්කොහුපිටිය -

*සූත්‍ර පිටකයේ බොහෝ සූත්‍ර වල දක්වා ඇති පරිදි, වෙන් වෙන්ව- **රූප** (ආධ්‍යාත්මික හා බාහිර), නාම (**වේදනා, සංඥා, සංඛාර** - සිතුවිලි) හා **විඤ්ඤාණ** (සිත) යන 'පංච-ස්කන්ධයන්', හේතුප්‍රත්‍යයෙන් ඇතිවන(සමුදය) හා හේතුනිරෝධයෙන් නැතිවන(නිරෝධය) අයුරු අසා දැන, 'නුවණින් දකින විට' අනුක්‍රමයෙන් ප්‍රත්‍යක්‍ෂවන **'පංචස්කන්ධයක' අනිත්‍ය හා අනාත්ම භාවයේ** අවබෝධය මත පංච**'උපාදාන'**ස්කන්ධවලට පත් නොවී **'භව නිරෝධයෙන්' නිවනෙහි** පිහිටන උත්තරීතර ගමන් මගෙහි මගසළකුණු නිරවුල්ව දැනගැනීමට-*

- **ශ්‍රී බුද්ධරක්ඛිත භික්‍ෂු පුහුණු ධර්මායතනය**, ගල්කඩවල පාර, කටුකැලියාව, අනුරාධපුර. 077 2470247 , 071 3249933.
- **ශ්‍රී බුද්ධරක්ඛිත ආශ්‍රමය**, මැටියගනේ, බෙලිගල, කෑගල්ල. 071 5950400.
- **විපස්සනා භාවනා මධ්‍යස්ථානය**, අංක 27/8/ඩී/1 පොල්හේනවත්ත පළමු පටුමග, ගඟබඩ පාර, සුවාරපොළ, පිළියන්දල. 071 8587545.
- **ශ්‍රී බෝධිඥානාරාමය**, අංක 33 සංඝමිත්තා මාවත, පූජනීය පෙදෙස, අනුරාධපුර. 071 4850106.
- **ශ්‍රී විජය ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානය**, මහඋළපිටිය, වයිහන්දිය, මීගමුව. 071 8363016.
- **ශ්‍රී සාරිපුත්ත වන අරණ**, කොරකහවැව, පණ්ඩුලගම, අනුරාධපුර. 071 4193656.
- **ශ්‍රී බෝධිරාජාරාමය**, පාට්ටගම, ගල්අතර, මාවනැල්ල. 071 8408780.
- **ශ්‍රී සම්බෝධි ආශ්‍රමය**, අඹගම්මන, නාරම්මල. 037 3975590.
- **ශ්‍රී සාරිපුත්ත ආශ්‍රමය**, දකුණු වාසල පාර, පූජා නගරය, අනුරාධපුර. 071 4193656.
- **ශ්‍රී අනුරුද්ධාරාමය**, අංක 34, අලුත් පාර, තිසාවැව, අනුරාධපුර. 071 8449225.

සදහම් ග්‍රන්ථ සහ පටිගත කරන ලද ධර්මදේශනා ශ්‍රවණය සඳහා වෙබ් අඩවි -

http://www.buddharakkithathero.org
https://www.youtube.com/user/katukeliyawa119
youtube – polhenwatta සහ dahampiyasa.org